

# මානව හිමිකම්

## මොඩියුලය 02

මානව හිමිකම්

## හැඳින්වීම

මොඩියුල 4 කින් සමන්විත පුහුණු මාර්ගෝපදේශයේ දෙවන මොඩියුලය මෙයයි. මෙම මොඩියුලය සහභාගීවන්නන්ට මානව හිමිකම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා දීමට උත්සාහ කරයි.

මෙම මොඩියුලය මඟින් මානව හිමිකම් යනු බටහිර සංකල්පයක්ය යන පොදු මතයට එරෙහිව ක්‍රියා කිරීම සඳහා මානව හිමිකම් පිළිබඳ දේශීයකරණය වූ, පුළුල් අවබෝධයන් දිරිමත් කරයි. තවද මෙම මොඩියුලය මඟින් ගිවිසුම්, ගිවිසුම් මත පදනම් වූ යාන්ත්‍රණ සහ ප්‍රඥප්ති මත පදනම් වූ යාන්ත්‍රණ හරහා මානව හිමිකම් යාන්ත්‍රණ දියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ දායකත්වය විමර්ශනය කරයි.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ PPT Slides භාවිතා කරමින් ශ්‍රී ලංකාව තුළ පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් පිළිබඳ සහභාගීවන්නන්ගේ හැකියාවන් වර්ධනය කෙරේ. මෙම මොඩියුලය ක්‍රියාත්මක කිරීම අවසානයේදී, මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමකදී සහන යාන්ත්‍රණයන්ට ප්‍රවේශ වන්නේ කෙසේද යන්න සහ ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ තොරතුරු වෙත ප්‍රවේශ වන්නේ කෙසේද යන්න සහභාගීවන්නන් දැන ගනු ඇත.

මෙම මොඩියුලය සැසි 7 කින් සමන්විත අතර පැය 6ක් පුරා පැවැත්වේ.



## අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කරන්න:

මොඩියුල 02 සහ අනෙකුත් ලියකියවිලි සඳහා අන්තර්ජාල ගත මාර්ග ඔස්සේ ප්‍රවේශ වීමට, පහත QR කේතය ස්කෑන් කරන්න:

නැතහොත් ඔබගේ වෙබ් බ්‍රවුසරයේ පහත URL එක ටයිප් කර පිවිසෙන්න:

## www.shorturl.at/xzV59

## සැසියන්හි සැලැස්ම

| ආරම්භක වේලාව | වෙන් කර ඇති කාලය | සැසිය |
|---|---|---|
| පෙ.ව. 09.00 | මිනිත්තු 15 | පළමු දිනය පිළිබඳ ආවර්ජනයක් |
| පෙ.ව. 09.15 | පැය 1 | සැසිය 01: මානව හිමිකම් යනු මොනවාද?<br>*ඉදිරිපත් කිරීම සහ සාකච්ඡාව* |
| පෙ.ව 10:15 | පැය 1 | සැසිය 02 : මානව හිමිකම් ඉතිහාසය<br>*කාලරාමුවක්* |
| පෙ.ව 11:15 | මිනිත්තු 15 | විවේකය |
| පෙ.ව 11:30 | පැය 1 | සැසිය 03 : ශ්‍රී ලංකාවේ මානව හිමිකම්<br>*ඉදිරිපත් කිරීම සහ Q&A* |
| ප.ව. 12:30 | පැය 1 | දිවා විවේකය |
| ප.ව. 1:30 | පැය 1 | සැසිය 04: මානව හිමිකම් සඳහා එක්සත් ජාතීන්ගේ දායකත්වය |
| ප.ව. 2:30 | මිනිත්තු 30 | සැසිය 05: ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වීම<br>*ඉදිරිපත් කිරීම සහ Q&A* |
| ප.ව. 3:00 | මිනිත්තු 45 | සැසිය 06: ඉන්දියානු අත්දැකීම<br>*ඉදිරිපත් කිරීම සහ Q&A* |
| ප.ව. 3:45 | මිනිත්තු 15 | විවේකය |
| ප.ව 04:00 | මිනිත්තු 45 | සැසිය 07: යෝග්‍යකාර්ත මූලධර්ම<br>*සාකච්ඡාව* |
| ප.ව 04:45 | මිනිත්තු 15 | අවසානය සහ අදහස් දැක්වීම |

# සැසිය 01: මානව හිමිකම් යනු මොනවාද?

*සාකච්ඡාවකින් අනතුරුව සිදුකරන ක්‍රියාකාරකම*

### කාලය
පැය 1 යි

### ඉලක්ක කණ්ඩායම
සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගීවන්නන් 30කි

### අරමුණු
මෙම සැසිය අවසානයේ,

- මානව හිමිකම් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කරගැනීමට සහ
- මානව හිමිකම්වල ලක්ෂණ ලැයිස්තුගත කිරීමට

සහභාගීවන්නන්ට හැකි වනු ඇත.

### අවශ්‍ය මෙවලම්
- Flip chart කඩදාසි සහ marker පෑන්
- ටේප්/ බිත්තියක් මත පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම සඳහා repositionable spray

### සකස් කිරීම
- PPT Slides

### පියවර
- සහභාගීවන්නන් කණ්ඩායම් 5කට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම මිනිත්තු 30ක් ලබාදී ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් සඳහා අවශ්‍ය දේවල් ලැයිස්තුවක් සටහන් කරගැනීමට පවසන්න. එකිනෙකා සමඟ කතා නොකරන ලෙස සහභාගගීවන්නන්ගෙන් ඉල්ලා සිටින්න.
- පළමුව සහභාගීවන්නන් විසින් මූලික අවශ්‍යතා ලියා තැබූ පසු සෑම කණ්ඩායමකටම විනාඩි 5-10ක කාලයක් ලබා දී පහත ප්‍රශ්න විමසන්න:

1. ඔබ රැකියාවක් කරනු ඇතැයි සිතා - ඔබට ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් අවශ්‍ය නම් ඔබට කුමන ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් අවශ්‍යද, ඔබට කුමන ආකාරයේ රැකියාවක් අවශ්‍ය වේද සහ ඔබ රැකියා ස්ථානයෙන් කුමන ආකාරයේ සැලකීමක් බලාපොරොත්තු වේද?
2. ඔබ අසනීපයෙන් සිටින බව සිතන්න. ඔබට කුමන ආකාරයේ සෞඛ්‍ය සේවාවක් අවශ්‍ය වේද?
3. ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් සඳහා ඔබට අවශ්‍ය කුමන ආකාරයේ රජයක්ද? ඔබ රජයෙන් කුමන ආකාරයේ සැලකීමක් බලාපොරොත්තු වේද?
4. ප්‍රචණ්ඩත්වය ඇත්නම් ඔබට ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගත කළ හැකිද?
5. ඔබට විරුද්ධව අපරාධයක් සහ අසාධාරණයක් සිදුවුවහොත් ඔබට සතුටින් හා තෘප්තිමත් ජීවිතයක් ගත කළ හැකිද?

- ලැයිස්තුගත කිරීම අවසන් වූ පසු, එක් එක් කණ්ඩායමට ඔවුන්ගේ ලැයිස්තු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින්න.
- කණ්ඩායම් වලට එක සමාන ලැයිස්තු තිබිය හැක. නව/අනන්‍ය ප්‍රතිචාර ඉස්මතු කරන්න
- සියලුම පෝස්ටර් බිත්තියක ප්‍රදර්ශනය කරන්න.
- ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගතකිරීම සඳහා අවශ්‍යතාවන් ලෙස සියලුම කණ්ඩායම් එක හා සමාන දේවල් ලැයිස්තුගත කර ඇති බව පැහැදිලි කරන්න. එයට හේතුව වන්නේ මිනිසුන් වශයෙන් අපගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සමාන වීමයි. හුදෙක් මනුෂ්‍යයකු වීම නිසා අපට යම් යම් අවශ්‍යතා සහ අභිලාෂයන් ඇත. අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය පදනම් වී ඇත්තේ ඔබ මනුෂ්‍යයෙකු වීම නිසා ඇති මෙම පොදු අවශ්‍යතා සහ අභිලාෂයන් වටා ය.
- සහභාගීවන්නන් විසින් ලැයිස්තුගත කරනු ලැබූ අවශ්‍යතා සහ අභිලාෂයන් සහ මානව හිමිකම් අතර සම්බන්ධය පරීක්ෂා කරන්න. සහභාගීවන්නන්ගේ ලැයිස්තුවේ ඇති සෑම අයිතමයක්ම ගෙන ඊට අනුරූප වන අයිතිය හඳුනා ගන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ. සමහර අවශ්‍යතා අයිතිවාසිකම් ගණනාවකට

සම්බන්ධ වන බව සලකන්න. හැකි නම් මෙම අයිතිය පිළිගන්නා ජාත්‍යන්තර මානව හිමිකම් ලේඛන වෙතද යොමු වන්න.

| හඳුනාගෙන ඇති අවශ්‍යතා | අනුරූප වන මානව හිමිකම් |
|---|---|
| **ආහාර** | ආහාර සඳහා ඇති අයිතිය |
| **ජලය** | පිරිසිදු ජලය සඳහා ඇති අයිතිය |
| **පවුල** | පවුලක් ගොඩනැගීම සඳහා ඇති අයිතිය |
| | කැමැත්ත ඇතිව නිදහසේ විවාහ වීමට ඇති අයිතිය |
| | දරුවන් ලැබීමට ඇති අයිතිය |
| | දරුවන් නොලැබීමට තීරණය කිරීමට ඇති අයිතිය (තම ශරීරය පිළිබඳව පුද්ගලයකුට ඇති ස්වයං පාලනය) |
| **ආදරය** | කැමති සහකරුවෙකු තෝරා ගැනීමේ අයිතිය |
| | ලිංගික දිශානතිය මත පදනම්ව වෙනස් කොට සැලකීමෙන් නිදහස් වීමට ඇති අයිතිය |
| **අවිහිංසාව** | වධහිංසාවට ලක් නොවීමට ඇති අයිතිය |
| | නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමට ඇති අයිතිය |
| | සමාජභාවීය සමානාත්මතාවය |
| | ශාරීරික දඬුවම්වලින් නිදහස් වීමට ඇති අයිතිය |
| **ප්‍රජාව අතර සම්බන්ධතා පැවැත්වීම /ආගමික කටයුතු** | ආගමික නිදහස සහ අන් අය සමග ආගම ඇදහීමට ඇති අයිතිය |
| | සමාගමයේ නිදහස |
| | කෙනෙකුගේ භාෂාව ප්‍රවර්ධනය කිරීමේ නිදහස |
| | සංස්කෘතිය භුක්ති විඳීමට ඇති නිදහස |
| **දූෂිත නොවන පාලකයන්** | ඡන්ද අයිතිය |
| | විධිමත්, නිදහස් හා සාධාරණ මැතිවරණයකට ඇති අයිතිය |
| **සෞඛ්‍යාරක්ෂාව** | සෞඛ්‍ය රැකවරණය සඳහා ඇති අයිතිය |
| | විද්‍යාත්මක දියුණුවේ ප්‍රතිලාභ ලබාගැනීමට ඇති අයිතිය |
| **අධ්‍යාපනය** | අධ්‍යාපනයට ඇති අයිතිය |
| | සිතීමේ නිදහස |
| | භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස |
| **රාජ්‍ය ගෞරවය** | සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම සහ වෙනස්කොට සැලකීමෙන් මිදීමට ඇති අයිතිය |
| **යුක්තිය** | නීතිය ඉදිරියේ සියලු දෙනා සමාන වීමට ඇති අයිතිය |
| | නීතියේ රැකවරණය එක සමානව ලැබීමට ඇති අයිතිය |
| | නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමට ඇති අයිතිය |
| | පිළියම් ලැබීමට ඇති අයිතිය |
| **නිවාස** | තමන්ටම කියා ඉඩමක් අයිති කර ගැනීමට ඇති අයිතිය |
| | වෘත්තියක යෙදීමට ඇති නිදහස |
| | පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය |
| **මුදල්** | රැකියාවක නිරත වීමට ඇති අයිතිය |
| | දේපල අයිති කර ගැනීමට ඇති නිදහස |
| **මානසික සෞඛ්‍ය** | විවේකයට ඇති අයිතිය |
| | මානසික සෞඛ්‍ය සේවා සඳහා ඇති අයිතිය |

- මානව හිමිකම් යනු හුදෙක් අප මනුෂ්‍යයන් වී ඉපදීම නිසා හිමිව ඇති අයිතීන් වන අතර ඒවා කිසිදු රාජ්‍යයක් විසින් ලබා දෙන ඒවා නොවන බව පැහැදිලි කරන්න. මානව හිමිකම් නොමැතිව මිනිසුන්ට සතුටින් හා තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට හෝ ඔවුන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ඉටු කරගැනීමට නොහැක. ජාතිය, ලිංග භේදය, ජාතික හෝ වාර්ගික සම්භවය, වර්ණය, ආගම, භාෂාව හෝ වෙනත් හේතූන් නොතකා මෙම විශ්වීය අයිතිවාසිකම් අප සැමට ආවේණික වේ. අප සියලු දෙනා මිනිසුන් වන බැවින් අපගේ අවශ්‍යතාවන් සහ අපේක්ෂාවන් අපට පොදු වේ. සියලුම කණ්ඩායම්වල ලැයිස්තු තුල සමාන අයිතමයන් තිබුණේ මෙම හේතුව නිසාය.
- මානව හිමිකම්වල ප්‍රධාන ලක්ෂණ සහ මානව හිමිකම් වටා ඇති මූලධර්ම slides උපයෝගී කරගනිමින් පැහැදිලි කරන්න.

## සටහන්

- ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ මූලාරම්භය වනුයේ මානව හිමිකම් පිළිබඳ විශ්වීයත්වයේ මූලධර්මයයි. මෙයින් අදහස් වනුයේ මානව හිමිකම් සඳහා අප සැමට එක හා සමානව හිමිකම් ඇති බවයි. UDHR මගින් පළමුව අවධාරණය කරන ලද මෙම මූලධර්මය, බොහෝ ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන්, ප්‍රකාශන සහ යෝජනා වල පුනරාවර්තනය වේ.

- මානව හිමිකම් අන්සතු කළ නොහැකි ය. විශේෂිත වූ අවස්ථාවන්හි දී සහ නියමිත ක්‍රියාවලියට අනුව හැර ඒවා බැහැර නොකල යුතුය. නිදසුනක් වශයෙන්, අධිකරණයක් මගින් යම් පුද්ගලයෙකු අපරාධයකට වරදකරු වුවහොත් නිදහසට ඇති අයිතිය සීමා කළ හැකිය.

- සියලුම මානව හිමිකම් බෙදිය නොහැකි වන අතර ඒවා එකිනෙකාට බැඳී පවතී. මෙයින් අදහස් වනුයේ එක් අයිතිවාසිකම් කට්ටලයක් අනෙකක් නොමැතිව සම්පූර්ණයෙන්ම භුක්ති විඳිය නොහැකි බවයි. නිදසුනක් වශයෙන්, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්වල ප්‍රගතිය උපකාරී වේ. එපරිද්දෙන්ම, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් උල්ලංඝණය කිරීම අනෙකුත් බොහෝ අයිතිවාසිකම්වලට අහිතකර ලෙස බලපෑ හැකිය.

- වෙනස්කොට නොසැලකීම: සර්ව සාධාරණත්වය සහ වෙනස් කොට නොසැලකීම යනු ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ මූලික මූලධර්ම වේ. නීතිය ඉදිරියේ සමාන ලෙස සැලකීමේ අයිතිය සහ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාය ඇතුළු විවිධ හේතූන් මත වෙනස් කොට සැලකීමෙන් ආරක්ෂා වීමේ අයිතිය ඇතුළු අනෙකුත් සියලු මානව හිමිකම් කිසිඳු භේදයකින් තොරව සෑම කෙනෙකුටම භුක්ති විඳීමට හිමිකම් ඇත.

UDHR හි 1 වන වගන්තියේ මෙසේ සඳහන් වේ: "සියලු මනුෂ්‍යයෝ නිදහස්ව උපත ලබා ඇති අතර ගරුත්වයෙන් සහ අයිතිවාසිකම්වලින් සමාන වෙති." 2 වන වගන්තියේ දක්වා ඇති වෙනස් කොට සැලකීමෙන් නිදහස් වීමේ අයිතිය මගින් මෙහි සඳහන් සමානාත්මතාවය සහතික කරයි.

- **රාජ්‍ය නීති සහ ප්‍රතිපත්ති** මගින් සෑම කෙනෙකුම වෙනස් කොට සැලකීමෙන් ආරක්ෂා කළ යුතුය. එසේම රාජ්‍ය නීති සහ ප්‍රතිපත්ති යනු ලොව පුරා සිටින මිලියන සංඛ්‍යාත සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්තික සමාජභාවීය සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට එරෙහිව ඍජු සහ වක්‍ර වෙන්ස්කොට සැලකීමට කිරීමට එරෙහිවීමේ මූලාශ්‍රය වේ. ලෝකයේ ජාතීන්ගෙන් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක්, කැමැත්ත මත පවතින සමරිසි සබඳතා අපරාධයක් ලෙස සලකයි. මෙම නීති මගින් පුද්ගලිකත්වයට සහ වෙනස් කොට නොසැලකීමට ඇති අයිතිවාසිකම් උල්ලංඝණය වන අතර, මේවා ජාත්‍යන්තර නීතියෙන්ද ආරක්ෂා කර ඇත. ඊට අමතරව මෙම නීතින් අත්අඩංගුවට ගැනීමේදී, නඩු පැවරීමේදී, සිරගත කිරීමේදී සහ රටවල් කිහිපයක මරණීය දණ්ඩණයටද පුද්ගලයන් නිරාවරණය කරයි. එවැනි නීතින් නිසා අපකීර්තියට, වෙනස් කොට සැලකීමට සහ අපයෝජනයන්ට බියවී, පරීක්ෂණ සහ ප්‍රතිකාර සඳහා ඉදිරිපත් වීම වැළැක්වීම මගින් HIV පැතිරීම නැවැත්වීමේ ප්‍රයත්නයන්ටද බාධා කරයි.

වෙනස්කොට සැලකීමේ තවත් අවස්ථා වන්නේ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්තික සමාජභාවීය, අන්තර් ලිංගික සහ කුවියර LGBTIQ පුද්ගලයින් යම් යම් රැකියාවල නියුතු වීම, නිදහස් කථනය සහ මහජන විරෝධතා සීමා කිරීමෙන් වෙනස් කොට සැලකීම සහ සමරිසි සබඳතාවල නීතිමය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම වේ. බොහෝ රාජ්‍යයන් සංක්‍රාන්තික සමාජභාවීය පුද්ගලයන්ට තම සමාජභාවී අනන්‍යතාවයට නීත්‍යානුකූල පිළිගැනීමක් ලබා ගැනීමේ කොන්දේසියක් ලෙස වන්ද්‍යාකරණයට ලක්විය යුතුවේ. එසේ නොමැතිව බොහෝ දෙනෙකු ස්ථාවර රැකියාවකින්, සෞඛ්‍ය ආරක්ෂණයෙන් සහ අධ්‍යාපනයෙන් බැහැර කර, අනෙකුත් මූලික අයිතිවාසිකම් ලබාදීමෙන් ප්‍රතික්ෂේප කර, සමාජයෙන් කොන්වී ජීවත්වීමට බල කෙරේ.

- රාජ්‍ය වගකීම: තමන්ගේම නීති සහ ප්‍රතිපත්ති මගින් ලිංගික දිශානතිය සහ සමාජභාවීය අනන්‍යතාව මත පදනම්ව පුද්ගලයන් වෙනස් කොට සැලකීම සිදු නොකරන බවටත්, තෙවන පාර්ශ්වයන් විසින් සිදු කරනු ලබන එවැනි වෙනස්කොට සැලකීම්වලට එරෙහිව නීතිමය රාමුව ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයන බවටත් වග බලා ගැනීමට රාජ්‍යයන්ට නීතිමය බැඳීමක් ඇත. මෙම බැඳීම සංස්කෘතිය, සම්ප්‍රදාය සහ ආගම ඉක්මවා යයි. ඔවුන්ගේ ඉතිහාසය හෝ කලාපීය විශේෂතා නොසලකා සියලුම රාජ්‍යයන් සෑම මිනිසෙකුගේම අයිතිවාසිකම් සහතික කළ යුතුය. LGBT පුද්ගලයින්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම ප්‍රතික්ෂේප කරන රාජ්‍යයන් ජාත්‍යන්තර නීතිය උල්ලංඝණය කරයි.

### සාරාංශය:

මානව හිමිකම් යනු මනුෂ්‍යයන් වීම නිසා වන අප සියල්ලන්ටම හිමිව ඇති අයිතිවාසිකම් වේ. ඒවා කිසිවකු විසින් ලබාදී ඇති හෝ කිසිවකු විසින් බැහැර කල හැකි අයිතීන් නොවේ. මානව හිමිකම් විශ්වීය, වෙන් කළ නොහැකි, බෙදිය නොහැකි සහ එකිනෙකා මත බැඳී පවතී.

# සැසිය 02: මානව හිමිකම් ඉතිහාසය

*කණ්ඩායම් වශයෙන් සහභාගීවන්නන් මානව හිමිකම් ඉතිහාසයේ සුවිශේෂී සිදුවීම් පැහැදිලි කරයි*

### කාලය
පැය 1 යි

### ඉලක්ක කණ්ඩායම
සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගීවන්නන් 30

### අරමුණු
මෙම සැසිය අවසානයේ,

- මානව හිමිකම්වල ඉතිහාසය විස්තර කිරීමට,
- එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව හිමිකම් ඉතිහාසයේ සිදුවීමක් ලෙස වෙන්කර හඳුනා ගැනීමට,
- ආගමික ඉගැන්වීම්වල මානව හිමිකම් පිළිබඳ දර්ශනය නිරීක්ෂණය කිරීමට

සහභාගීවන්නන්ට හැකි වනු ඇත.

### අවශ්‍ය මෙවලම්
- කාඩ්පත් 7ක් ලෙස වෙන් කර ඇති, පහත සඳහන් 'සටහන්' කොටසේ මුද්‍රිත පත්‍ර/කාඩ්පත්.
- Flip chart කඩදාසි සහ marker පෑන්

### සකස් කිරීම
- PPT Slides

### පියවර

- මෙම සැසියේදී සහභාගීවන්නන් මානව හිමිකම්වල ඉතිහාසය පිළිබඳ සොයා බලන බව පැහැදිලි කරන්න.
- සහභාගීවන්නන් කණ්ඩායම් 7කට බෙදා සෑම කණ්ඩායමකටම කාඩ්පතක්/මුද්‍රිත පත්‍රයක් ලබා දෙන්න. කුඩා කණ්ඩායම් සඳහා කෙටි විස්තර සහිත කාඩ්පත් ලබා දිය හැක.
- කාඩ්පත් කියවා flip chart පත්‍රයේ අදාල කතාව හෝ සිදුවීම පැහැදිලි කිරීමට සහභාගීවන්නන්ට විනාඩි 20ක කාලයක් ලබාදෙන්න.
- අමතර තොරතුරු සඳහා සහභාගීවන්නන්ට අන්තර්ජාලය උපයෝගී කරගත හැක.
- කණ්ඩායම් විසින් සිදුවීම් පැහැදිලි කළ පසු, නිදර්ශන භාවිතා කරමින් කණ්ඩායමේ සෙසු අයට කතාව පවසන ලෙස එක් එක් කණ්ඩායමෙන් ඉල්ලා සිටින්න.
- මානව හිමිකම් පිළිබඳ සමකාලීන අවබෝධයට අදාළ වන ප්‍රධාන මූලධර්ම සහ සමාන අයිතිවාසිකම් පිළිගෙන ඇති නවීන මානව හිමිකම් ලේඛන ඉස්මතු කරන්න.
- UDHRහි ඉදිරිපත් කිරීම කරන විට, තිරය මත UDHR විවෘත කර, සහභාගීවන්නන් සමග එක්ව වගන්ති දෙස ඉක්මණින් බලන්න.

  https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights
- UDHRහි සිංහල සහ දෙමළ භාෂා පරිවර්තන මෙතැනින් සොයා ගත හැක:
  https://www.ohchr.org/EN/UDHR/Documents/UDHR_Translations/snh.pdf

  https://www.ohchr.org/EN/UDHR/Documents/UDHR_Translations/tcv.pdf
- සහභාගීවන්නන්ට අදහස් දැක්වීමට සහ ප්‍රශ්න ඇසීමට  අවස්ථාවක් ලබා දෙන්න.

# සටහන්

## ආගම

මානව හිමිකම් පිළිබඳ දර්ශනය ලෝකයේ සෑම ආගමකම අන්තර්ගතව ඇත.

ධර්මය අනුගමනය කිරීමේදී මනුෂ්‍යයෙකුට අවශ්‍ය වන වටිනාකම් සහ ආකල්ප ගණනාවක් හින්දු ආගමික ග්‍රන්ථවල සඳහන් කර ඇත. උදාහරණ ලෙස උඩඟු නොවීම, කුහක නොවීම, සත්‍යය කථා කිරීම, හානිකර නොවීම, උපකාර කිරීම, ඍජු බව සහ සියලු සත්වයන් කෙරෙහි කරුණාව දැක්වීම ගත හැකි ය. අවිහිංසාව බොහෝ විට පරම ධර්මතාවයක් ලෙස සැලකේ.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වන කාලය වන විට මනුෂ්‍ය පරිත්‍යාගයන් බහුල විය, සූරාකෑම, වහල්භාවය සහ ලිංගික අපයෝජනයන් බහුලව සිදු විය. බුදුරජාණන් වහන්සේගේ සියලු දුක් දුරු කරන ප්‍රතිකර්මය සියලු ජීවීන්ගේ සමානාත්මතාවය මත පදනම් විය. අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය බෞද්ධ දර්ශනයට ආගන්තුක නොවේ. එය ව්‍යංගයෙන් ප්‍රකාශ කර ඇත. අයිතිවාසිකම් සහ යුතුකම් ලෙස විග්‍රහ කළ හැකි රාජකාරීන් අන්‍යෝන්‍ය බැඳීම් ස්වරූපයෙන් සියල්ලන්ටම ඇත. ධර්මය මඟින් පැහැදිලිවම යුතුකම් ප්‍රකාශ කර ඇති අතර අයිතිවාසිකම් ව්‍යංගයෙන් ප්‍රකාශ කර ඇත. නිදසුනක් වශයෙන්, සෑම පුද්ගලයෙකුටම කිසිම ජීවියෙකුට හානියක් නොකිරීමට යුතුකමක් ඇත (පංච ශීලයෙහි පළමු සිල්පදයේ අන්තර්ගත වේ), මන්ද යත් සෑම ජීවියෙකුටම ජීවත් වීමට අයිතියක් ඇති බැවිනි.

මේ සම්පූර්ණ නීතියම එක පනතකට ගෙන, "නුඹට මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේමකරන්න" ලෙස බයිබලයේ සඳහන් ව ඇත. "නුඹේ අසල්වාසියාට ප්‍රේමකරන්න"යනු අත්‍යවශ්‍යයෙන්ම සියලුම දෙනාගේ මානව හිමිකම් පිළිබඳව සඳහන් වන ප්‍රකාශයකි. නිදහස, සමානාත්මතාවය සහ ගෞරවය යනු සියලුම දෙනා මනුෂ්‍යයන්ව ඉපදීම නිසාම හිමිව ඇති ඒවා වේ.

ඉස්ලාම් ආගමේ මානව හිමිකම් දැඩි ලෙස දෙවියන් වහන්සේ සහ දෙවියන් වහන්සේ පමණක් නීති සපයන තැනැත්තා ලෙස සහ සියලු මානව හිමිකම්වල මූලාශ්‍රය යන විශ්වාසය තුළ පදනම් වී ඇත. එහි දේවමය සම්භවය හේතුකොට ගෙන, කිසිම පාලකයෙකුට, රජයකට, සභාවකට හෝ අධිකාරියකට දෙවියන් විසින් ප්‍රදානය කරන ලද මානව හිමිකම් සීමා කිරීමට හෝ උල්ලංඝණය කිරීමට හෝ ඒවාට යටත් වීමටද නොහැකිය.

## මැග්නා කාර්ටා (1215)

සිවිල් යුද්ධයේ තර්ජනය යටතේ, 1215 දී එංගලන්තයේ ජෝන් රජු විසින් මැග්නා කාර්ටා ප්‍රකාශනය කරන ලද අතර එය අයිතීන් පිළිබඳව වන මුල්ම ප්‍රකාශනයකි. පරම බලධාරියා නීතියේ ආධිපත්‍යයට යටත් වන බවත්, 'නිදහස් මිනිසා' යම් යම් අයිතීන් දරණ බවත් මැග්නා කාර්ටා නියම කළේය. එමඟින් ආගමික නිදහසට ඇති අයිතිය ද තහවුරු කළේය.

## The British Bill of Right (1689)

1776 ඇමරිකානු නිදහස් ප්‍රකාශය

- සියලුම මිනිසුන් සමාන බවත්, ඔවුන්ගේ නිර්මාතෘ විසින් ඔවුන්ට අහිමි කළ නොහැකි යම් යම් අයිතිවාසිකම් ලබා දී ඇති බවත්, ඒ අතර ජීවිතය, නිදහස සහ සතුට ඇති බවත් ප්‍රකාශ කරන ලදී.
- කෙසේ වෙතත්, මෙම ප්‍රකාශනය වහල්භාවය ආරක්ෂා කළේය

## මිනිසාගේ සහ පුරවැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශය (1789)

මර්දනකාරී බදු ගැසීම, වැඩවසම්වාදී මර්දනය සහ රදළයන් භුක්ති විඳින වරප්‍රසාද පිළිබඳ අමනාපය යන හේතුන් නිසා ප්‍රංශ ජනතාව කැරලි ගසා රාජාණ්ඩුව පෙරලා දැමූහ. මෙම විප්ලවය මිනිසාගේ සහ පුරවැසියාගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයට තුඩු දුන් අතර එමඟින් පහත සඳහන් කරුණු හඳුනා ගන්නා ලදී.

- මිනිසුන් නිදහස්ව ඉපිද, නිදහස්ව හා සමාන අයිතිවාසිකම් සහිතව ජීවත්වේ.
- දේශපාලන සංගමයේ ඉලක්කය වන්නේ නිදහස, දේපළ, ආරක්ෂාව සහ පීඩනයට එරෙහි ප්‍රතිරෝධය වැනි ස්වභාවික අයිතීන් ගොඩනැගීම වේ.
- නිදහස සමන්විත වී ඇත්තේ අන් අයට හානියක් නොවන ඕනෑම දෙයක් කිරීමෙනි.
- නීතිය යනු පොදු කැමැත්තේ ප්‍රකාශනයයි. එය ගොඩනැගීම සඳහා දායක වීමට සියලුම පුරවැසියන්ට අයිතියක් ඇත.
- නීතියට අනුව මිස කිසිම මිනිසෙකුට චෝදනා කිරීමට, අත්අඩංගුවට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට නොහැකිය.

- වරදකරු බව ඔප්පු වන තුරු පුද්ගලයෙකු නිර්දෝෂී වේ.
- සිතුවිලි සහ අදහස් නිදහසේ සන්නිවේදනය කිරීම මිනිසාගේ අයිතියකි.
- පුද්ගලික දේපල සඳහා මිනිසාට අයිතියක් ඇත

1789 ඔක්තෝම්බර් මාසයේදී වර්සයිල්ස් හි කාන්තා පාගමන පැවැත්වුවද, ප්‍රංශ ප්‍රකාශනය මගින් කාන්තා අයිතිවාසිකම් පිළිගනු ලැබුවේ නැත.

## 1945 දී එක්සත් ජාතීන්ගේ උපත

දෙවන ලෝක යුද්ධයෙන් පසු මානව හිමිකම් පිළිබඳ අදහස වඩාත් ශක්තිමත් විය. නාසි ජර්මනිය විසින් මිලියන හයකට අධික යුදෙව්වන්, සින්ටි සහ රොමානි ජනතාව, සමරිසි පුද්ගලයන් සහ ආබාධිත පුද්ගලයින් සමූලඝාතනය කිරීම මුලු ලෝකයම භීතියට පත් කළේය. 1945 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට රටවල් එකතු විය.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය යනු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භක ලියවිල්ලයි. එය 1945 ජූනි 26 වන දින, ජාත්‍යන්තර සංවිධාන පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව අවසානයේදී අත්සන් කරන ලද අතර, එය 1945 ඔක්තෝබර් 24 වන දින සිට බලාත්මක විය.

ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම සමාන අයිතිවාසිකම් පිළිගනු ලැබූ පළමු මානව හිමිකම් ලේඛනය වන්නේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියයි.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මගින් එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන ලෙසඃ මහා මණ්ඩලය (මහා මන්ත්‍රණ සභාව), ආරක්ෂක මණ්ඩලය, ආර්ථික හා සමාජීය මණ්ඩලය, භාරකාරත්ව මණ්ඩලය, අන්තර්ජාතික අධිකරණය සහ ලේකම් කාර්යාලය ස්ථාපිත කර ඇති අතර මෙම එක් එක් ආයතනවල බලතල සහ කර්තව්‍යයන්ද දක්වා ඇත.

## 1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

1948දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) යෝජනාවක් මගින් සම්මත කරන ලදී. UDHR මගින් දෙවන ලෝක සංග්‍රාමයේ අමානුෂික ප්‍රචණ්ඩත්වය හඳුනාගත් අතර ඒ හා සමාන ව්‍යසනයක් වැලැක්වීමේ අවශ්‍යතාවය සාකච්ඡා කරයි. 'මානව හිමිකම් නොතැකීම සහ අවඥාවට ලක්කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් වර්ගයාගේ හෘද සාක්ෂිය සාහසික පීඩනයට භාජනය කෙරෙන ම්ලේච්ඡ කෲරකම් සිදුවී ඇති හෙයින්ද,..., බියෙන් සහ අගහිඟකමින් තොරවීමේ නිදහසත් භුක්ති විඳීමට හැකි ප්‍රජාවක් ඇරඹීම පොදු ජනතාවගේ ශ්‍රේෂ්ඨතම අපේක්ෂාව ලෙස ප්‍රකාශයට පත්වී ඇති හෙයින්ද...,' ලෙස මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පූර්විකාව සඳහන් කරයි.

UDHR යනු ඓතිහාසික ජයග්‍රහණයකි. කෙටුම්පත් කිරීමේ අනුකමිටුවේ සාමාජික, චිලියේ හර්නන් සැන්ටා කෲස් UDHR සම්මත කිරීමේ මොහොත සිහිපත් කරමින් මෙසේ ලියයි, 'මනුශ්‍යත්වයට උත්තම වටිනාකමක් ලබාදෙන සම්මුතියක් ඇති කර ගත්, සැබවින්ම වැදගත් ඓතිහාසික සිදුවීමකට මා සහභාගී වන බව මට පැහැදිලිව වැටහුණි... සෑම අක්ෂාංශකම සිටින පිරිමින් සහ ගැහැනුන් අතර, කිසිඳු ජාත්‍යන්තර පසුබිමක මා නැවත නොදුටු, සැබෑ සහයෝගීතාවයේ සහ සහෝදරත්වයේ වාතාවරණයක් හැගුණි."

UDHR යනු සියලුම මනුෂ්‍ය වර්ගයා සඳහා විශ්වීය අයිතිවාසිකම් පුළුල්ව දක්වා ඇති ඒ ආකාරයේ පළමු ලේඛනයයි. UDHR යනු අද වන විට භාෂා 512කට පරිවර්තනය කර ඇති ලෝකයේ වඩාත්ම දන්නා සහ වඩාත්ම උපුටා දක්වන ලද මානව හිමිකම් ලේඛනයයි. එසේම UDHR විසින් නීත්‍යානුකූලව බැඳී ඇති මානව හිමිකම් ගිවිසුම් රාශියකට ආභාෂය ලබා දී ඇති අතර, එහි අන්තර්ගතයන් සමහරක් සම්ප්‍රදායික ජාත්‍යන්තර නීතියේ කොටසක් ලෙසද පිළිගෙන ඇත.

### සාරාංශය

මානව හිමිකම් පිළිබඳ අපගේ නූතන අවබෝධය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ ඉතා සමීපව බැඳී ඇත. කෙසේ වෙතත්, මානව හිමිකම් පිළිබඳ සාරධර්ම ඉතිහාසයෙන් සොයාගත හැකිය. ලෝකයේ සියලුම ආගම් යම් ආකාරයකින් සියුලු මිනිසුන් සමානය යන මූලධර්ම ය අන්තර්ගත කර ඇත.

කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා සම්බන්ධීකරණ ප්‍රවේශයක් අනුගමනය කරමින් මානව හිමිකම් ක්ෂේත්‍රයට විශිෂ්ට දායකත්වයක් ලබා දී ඇත. මීළඟ සැසියේදී අපි එක්සත් ජාතීන්ගේ කාර්යභාරය සවිස්තරාත්මකව විමසා බලමු.

# සැසිය 03: ශ්‍රී ලංකාවේ මානව හිමිකම්

*ඉදිරිපත් කිරීම සහ Q &A*

### කාලය
පැය 1 යි

### ඉලක්ක කණ්ඩායම
සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගීවන්නන් 30

### අරමුණු
මෙම සැසිය අවසානයේ,

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය වෙත යොමු වීමට,
- තෝරාගත් මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රධාන අංග හඳුනා ගැනීමට: වධ හිංසාවලින් නිදහස, සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම, අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන් සහ රඳවා තබා ගැනීමෙන් නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, රැස්වීමේ සහ සමාගමයේ නිදහස, සහ තොරතුරු දැනගැනීමේ අයිතිය,
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු සෙවීම සම්බන්ධයෙන් මූලික පියවර තේරුම් ගැනීමට

සහභාගිවන්නන්ට හැකි වනු ඇත,

### අවශ්‍ය මෙවලම්
- Flip chart කඩදාසි සහ පෑන්
- මෙම සැසි සැලැස්ම අවසානයේ 'ඇමුණුමෙහි' මුද්‍රණ පිටපත් 30ක්
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ මුද්‍රණ පිටපත් 30ක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිංහලෙන් සහ දෙමළෙන් මෙතැනින් සොයාගත හැක.
  - ✓ ඉංග්‍රීසි https://www.parliament.lk/files/pdf/constitution.pdf
  - ✓ සිංහල https://www.parliament.lk/files/pdf/constitution-si.pdf
  - ✓ දෙමළ https://www.parliament.lk/files/pdf/constitution-ta.pdf
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ මුද්‍රණ පිටපත් 30ක්. ඔබට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් පිටපතක් රුපියල් 21 බැගින් මිලදී ගත හැක.

✓ ඉංග්‍රීසි https://www.media.gov.lk/images/pdf_word/2016/12-2016_E.pdf

✓ සිංහල https://gic.gov.lk/gic/images/stories/pdf/rti_sin.pdf

✓ දෙමළ http://www.rticommission.lk/web/images/pdf/act/rti-act-ta-13122018.pdf

### සකස් කිරීම
- Slides

### පියවර
- සහභාගීවන්නන් සෑම දෙනෙකුටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ පිටපතක් ලබා දෙන්න.
- සහභාගීවන්නන් කණ්ඩායම් 5 කට බෙදන්න. මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ අදාළ කොටස් සහ අමතර මුද්‍රණ පිටපත් කියවීමට මිනිත්තු 20ක් වැය කරන ලෙස සෑම කණ්ඩායමකටම පවසා, මිනිත්තු 3-5ක ඉදිරිපත් කිරීමක් සඳහා flip chart පත්‍රවල ප්‍රධාන කරුණු ලියා සූදානම් වීමට ඉඩ ලබාදෙන්න.
  1. වධ හිංසාවලින් නිදහස
  2. සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම
  3. අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන් සහ රඳවා තබා ගැනීමෙන් නිදහස

4. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, රැස්වීමේ සහ සමාගමයේ නිදහස
5. තොරතුරු දැනගැනීමේ අයිතිය

- සෑම කණ්ඩායමකටම ඉදිරිපත් කිරීමට සහ ප්‍රධාන කරුණු ඉස්මතු කිරීමට විනාඩි 5ක කාලයක් ලබාදෙන්න.
- සියලුම කණ්ඩායම් ඉදිරිපත් කළ පසු සහභාගීවන්නන්ට slides පෙන්වන්න. ඉදිරිපත් කිරීම සඳහා සටහන් පහත 'සටහන්' කොටසේ සපයා ඇත.

## සටහන්

### ජීවත්වීමේ අයිතිය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ජීවත්වීමේ අයිතිය සෘජුව පිළිගෙන නැති නමුත් උසාවිය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12 සහ 13(4) යන ව්‍යවස්ථාවන් කියවමින් නඩු තීන්දු මඟින් මෙම අයිතිය පිළිගෙන ඇත. *ශ්‍රියානි සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ, ස්ථානාධිපති පයාගල පොලිස් ස්ථානය* යන නඩු තීන්දුව බලන්න. *රත්නායක තරංගා ලක්මාලි එදිරිව නිරෝෂන් අබේකෝන්* නඩු තීන්දුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේ පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවෙකු අධිකරණ තීන්දුවකින් තොරව මරණයට පත් කිරීම ජීවත්වීමේ අයිතිය උල්ලංඝණය කිරීමක් බවයි.

### වධහිංසාවලින් නිදහස

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව සහ 1994 අංක 22 දරණ වධහිංසාවට සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය පනත යටතේ සහතික කර ඇත.

### සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇත.

### අත්තනෝමතික අත් අඩංගුවට ගැනීමෙන් සහ රඳවා තබා ගැනීමෙන් නිදහස

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇත.

### අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, රැස්වීමේ සහ සමාගමයේ නිදහස

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇත.

### තොරතුරු දැනගැනීමේ අයිතිය

රාජ්‍යය සහ රාජ්‍ය ආයතන නඩත්තු වන්නේ පුරවැසියන්ගෙන් අය කරන බද්දෙනි. එබැවින් රාජ්‍ය බලධාරීන් විසින් මහජන මුදල් වියදම් කරන ආකාරය පිළිබඳ තොරතුරු දැනගැනීමේ අයිතිය ජනතාවට තිබීම වැදගත්ය.

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වැනි වගන්තියේ සඳහන් වන ආකාරයට, "තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත. අනුන්ගේ බාධාවක් නොමැතිව, තම මත දැරීමටත්, දේශ සීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමටත් හා දීමටත් ඇති අයිතිය ද ඊට ඇතුළත් ය." සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) සඳහන් වගන්තියද (19 වන වගන්තිය) මේ හා සමානව ලියා දක්වා ඇත.

2011 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් ICCPR හි 19වන වගන්තිය (අදහස් දැක්වීමේ සහ ප්‍රකාශනයේ නිදහස) පිළිබඳ සාමාන්‍ය නිර්දේශ (General Comment) ප්‍රකාශයට පත් කළේය. ඒ අනුව එම වගන්තියට පොදු ආයතන විසින් දරා සිටින තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පොදු අයිතියක් ඇතුළත් බව පිළිගෙන ඇත. අනෙකුත් අයිතිවාසිකම් සමඟ සම්බන්ධව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ICCPR හි අනෙකුත් විධිවිධාන මඟින් ආමන්ත්‍රණය කර ඇති බව එය වැඩිදුරටත් සඳහන් කළේය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14A ව්‍යවස්ථාව (2015 දී 19 වැනි සංශෝධනය මඟින් එකතු කරන ලද) තොරතුරු දැනගැනීමේ අයිතිය සහතික කරයි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතද (2016 අංක 12 දරණ) මෙම අයිතිය තහවුරු කරයි.

### සම්පත් දායකයා වෙත සටහනක්

පහත සඳහන් වගන්ති වල අන්තර්ගතය පරීක්ෂා කරන ලෙස සහභාගීවන්නන්ගෙන් ඉල්ලා සිටින්න:

- පනතේ 43 වන වගන්තියේ සඳහන් අර්ථ නිරූපණය - තොරතුරු යනු කුමක්ද යන්න සහ පොදු අධිකාරියක් යනු කුමක්ද යන්න.
- 23 සිට 29 දක්වා වගන්තිවල සඳහන් තොරතුරු ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිය.

- 35, 36 සහ 40 වගන්තිවල සඳහන් තොරතුරු වෙත ප්‍රවේශ වීම.
- 5 වන වගන්තියේ සඳහන් වන ව්‍යතිරේක සහ
- අභියාචනා ක්‍රියාවලිය සඳහන් වන වගන්ති.

## මූලික අයිතිවාසිකම් සීමා කිරීම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වැනි ව්‍යවස්ථාව මූලික අයිතිවාසිකම් පිළිබඳ යම් සීමාවන් ලැයිස්තුගත කරයි:

1. 13 වන ව්‍යවස්ථාවේ (5) වන සහ (6) වන අනුව්‍යවස්ථාවලින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද, රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට පමණක් යටත්වය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය' යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ තත් කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝගද ඇතුළත් වන්නේ ය.
2. 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද, වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාසය හෝ වරදකට පෙළඹවීම හා සම්බධව නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.
3. 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද, වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.
4. 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද, වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.
5. 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (උ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා හෝ-

(අ) යම් වෘත්තියක යෙදී සිටීමට හෝ යම් රැකියාවක්, කර්මාන්තයක්, වෙළෙඳ හෝ ව්‍යවසායක් පවත්වාගෙන යාමට අවශ්‍ය වෘත්තීය, කාර්මික, අධ්‍යාපනික, මූල්‍ය සහ වෙනත් සුදුසුකම් සම්බන්ධයෙන් සහ එම මූලික අයිතිවාසිකමකට හිමිකම් ලබන තැනැත්තන්ට බලපත්‍ර දීම සහ ඒ තැනැත්තාගේ විෂයයෙහි විනය පාලනය සම්බන්ධයෙන්; සහ

(ආ) රජය විසින් හෝ රාජ්‍ය නියෝජිත ආයතනයක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, කාර්මික ව්‍යාපාරයක්, සේවාවක් හෝ ව්‍යවසායක් පුරවැසි සහභාගීත්වය නොමැතිව හෝ පුරවැසි කොටසක සහභාගීත්වය ඇතිව හෝ අන්‍යාකාරයකින් හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන්, නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

6. 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඌ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.
7. 12 වන ව්‍යවස්ථාවෙන්, 13 වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන අනුව්‍යවස්ථාවලින් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද, රාජ්‍ය ආරක්ෂාවද, රටේ යථා පැවැත්ම ද, තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදැරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය සඳහා යුක්ති සහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිසත්, නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා "නීතිය' යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ තත් කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝගද ඇතුළත් වන්නේ ය.
8. 12 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවෙන්, 13 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම්, සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයන්ට, පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ රටේ යථා පැවැත්ම භාරව සිටින වෙනත් හමුදාවල සාමාජිකයන්ට අදාළ වීමේ දී එම අයිතිවාසිකම් භුක්තිවිඳිය හැක්කේද, ක්‍රියාත්මක විය හැක්කේද ඔවුන්ගේ කාර්යයන් යථා පරිදි ඉටු කරවා ගැනීම සහ ඔවුන් අතර විනය පවත්වා ගැනීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

## පවතින නීතිය දිගටම ක්‍රියාත්මක වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි ව්‍යවස්ථාවට අනුව පවත්නා නීතීන් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට අනුකූල නොවුවද එකී සියලු පවත්නා නීති බලාත්මකව ක්‍රියාත්මක වේ. මෙය ශ්‍රී ලංකාවේ අයිතිවාසිකම් පිළිබඳ නීතියේ ප්‍රධාන හිඩැසක් වේ.

1. පවත්නා සියලුම ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති මෙම පරිච්ඡේදයේ පූර්ව විධිවිධානවලට අනුකූල නොවුවද එකී නීති වලංගු වන අතර ක්‍රියාත්මක විය යුතුය.
2. පවත්නා ඕනෑම ලිඛිත නීතියක් මගින් පිළිගත් ඕනෑම ආකාරයක දඬුවමකට නිසි අධිකරණයක නියෝගයක් මත කිසියම් පුද්ගලයෙකු යටත් කිරීම මෙම පරිච්ඡේදයේ විධිවිධානවලට පටහැනි නොවිය යුතුය.

## FR උල්ලංඝණය සඳහා පිළියමක්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන ව්‍යවස්ථාවෙහි සඳහන් වන ආකාරයට, 'මේ පර්ච්ඡේදයේ විධිවිධාන යටතේ යම් තැනැත්තකුට හිමි වන යම් මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මඟින් උල්ලංගණය කර තිබීම හෝ උල්ලංඝණය කිරීමට අත්‍යාසන්නව තිබීම හෝ සම්බන්ධයෙන් 126 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේය.'

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව මගින් පුද්ගලයකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදුවී ඇති විට අධිකරණමය සහනයක් වෙත ප්‍රවේශ වීමේ ක්‍රියාමාර්ගය පැහැදිලි කරයි.

1. III වන පරිච්ඡේදයෙන් හෝ IV වන පරිච්ඡේදයෙන් හෝ ප්‍රකාශ කොට පිළිගන්නා ලද යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් යම් විධායක ක්‍රියාවක් මඟින් හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීමට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේය.
2. තමාට සම්බන්ධ එවැනි යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් යම් විධායක ක්‍රියාවක් හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් හෝ කඩ කොට ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පවතින බවට යම් තැනැත්තකු විසින් දෝෂාරෝපනයක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් ම නැතහොත් ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකුගේ මාර්ගයෙන්, එතැන් පටන් මාසයක් ඇතුළත, එම කඩ කිරීමෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටින ඉල්ලීමක්, තත් කාලයේ බලපවත්නා අධිකරණ රීතිවලට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණය අමතා ඉදිරිපත් කරන ලිඛිත පෙත්සමක් මගින් කළ හැක්කේය. එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් පසුව පමණක් එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කරගෙන යා හැක්කේය. එසේ අවසරය ඉල්ලා සිටින විට අවස්ථාවෝචිත පරිදි ඒ අවසරය ප්‍රදානය කිරීම හෝ අවසරය දීම ප්‍රතික්ෂේප කිරීම හෝ විනිශ්චකාරවරයන් දෙදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් කළ හැක්කේය.
3. හේබියස් කෝපුස්, සර්ටියොරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මන්ඩාමුස් හෝ ක්වෝ වොරොන්ටෝ ස්වභාවයේ වූ රිට් ආඥා සඳහා කරන ලද ඉල්ලීමක් අභියාචනාධිකරණයෙහි විභාග කිරීමේදී, ඒ ඉල්ලීමේ පර්ශවකරුවකු විසින්, III වන පරිච්ඡේදයේ හෝ IV වන පරිච්ඡේදයේ විධිවිධාන කඩකර ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව ඇති බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ඇති බව ඒ අධිකරණයට පෙනී ගිය අවස්ථාවක ඒ කාරණය තීරණය කිරීම සඳහා ඒ අධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත නොපමාව යොමු කළ යුත්තේය.
4. මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ සහ (3) වන අනුව්‍යවස්ථාවේ සඳහන් යම් පෙත්සමක් හෝ යොමු කිරීමක් සම්බන්ධයෙන් අවස්ථාගත කරුණු අනුව යුක්ති සහගත යයි හා සාධාරණ යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන සහනයක් ප්‍රදානය කිරීමට හෝ විධානයක් දීමට හෝ මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකමක් කඩ වී නොමැති බව ඒ අධිකරණයේ මතය වේ නම් ඒ කාරණය අභියාචනාධිකරණයට ආපසු යොමු කිරීමට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ඇත්තේය.
5. මේ ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද යම් පෙත්සමක් හෝ කරන ලද යම් යොමු කිරීමක් පිළිබඳව ඒ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ නැතහොත් යොමු කිරීම කරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත විසින් විභාග කොට කටයුතු නිම කළ යුත්තේය.

## 1994 අංක 22 දරණ වධහිංසාවට සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය පනත

වධහිංසා පැමිණවීම තහනම් කිරීම යනු විශ්වීය වශයෙන් වඩාත් පිළිගත් මානව හිමිකම් වලින් එකක් වන අතර එය ජාත්‍යන්තර නීතියේ 'ජුස් කෝගෙන්ස්' (Jus Cogens) හෝ නියමබැඳි සම්මතයක් (peremptory norm) යන තත්ත්වයට පත්ව ඇති අතර, වධහිංසා කරන පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට බැඳීමක් (erga omnes) සියලු රාජ්‍යයන්ට ඇති කරයි. 1994 අංක 22 දරණ වධහිංසාවට සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත

සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය පනත සම්මත කිරීම මගින් ශ්‍රී ලංකාව වධහිංසාවට එරෙහි ප්‍රඥප්තිය ශ්‍රී ලංකා නීතියට ඇතුළත් කළේය.

වධහිංසා පැමිණවීම, අමානුෂික හා අවමන් සහගත ලෙස සැලකීම මහාධිකරණයේ විභාග කළ හැකි බරපතළ වරදක් ලෙසින් සහ වරදකරුට අවම වශයෙන් වසර හතකට නොඅඩු සහ වසර දහයකට නොවැඩි සිරදඬුවමක් සහ රුපියල් දසදහසකට නොඅඩු රුපියල් පනස් දහසකට වඩා නොවැඩි දඩයක් පැනවීම සඳහා මෙම පනත මගින් විධි විධාන සලසා තිබේ . මෙය සංඥෙය සහ ඇප දිය නොහැකි වරදක් ලෙසද වර්ග කර ඇත.

ප්‍රධාන වශයෙන් රජයේ අකමැත්ත හේතුවෙන් ප්‍රායෝගිකව මෙම පනත භාවිතා කිරීමේ ප්‍රගතිය මන්දගාමී වී ඇත. උදාහරණ ලෙස, නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන්, යම් අපරාධකරුවන්ට එරෙහිව අධිචෝදනා ඉදිරිපත් කිරීමට ප්‍රතික්ෂේප කිරීම, දේශපාලන මැදිහත්වීම් වැඩි වීම යනාදිය සැලකිය හැක. නීතිපතිවරයා විසින් පොලිසිය හරහා නඩු පැවරිය යුතු අතර බොහෝ දුරට අපරාධකරුවන් වන්නේ පොලීසිය වන බැවින් නීතිපති දෙපාර්තමේතුව මගින් ඔවුන් නියෝජනය කල යුතු බැවින් මෙය බැඳියා පිළිගැටුමකට (conflict of interests) හේතු වේ. පැමිණිලි සිය ගණනක් ඉදිරිපත් කළද, නඩු පැවරුවද, විනිශ්චය මට්ටමට පැමිණෙන්නේ එයින් ස්වල්පයක් පමණක් වන අතර මූලික අයිතිවාසිකම් පෙත්සමක් හරහා ශ්‍රේෂ්ඨාධිකරණයට ප්‍රවේශ වීම වඩාත් හොඳ විකල්පයක් වේ.

නීතිය සහ සමාජ භාරය මගින් සිදුකරනු ලබන ඉතාමත් මෑත කාලීන් වාර්තාවක (2021) ජුනි) සඳහන් වන ආකාරයට, 2010 සහ 2018 අතර මානව හිමිකම් කොමිසමට (HRCSL) සෑම දින දෙකකට වරක් වධහිංසා පැමිණවීම් පිළිබඳ පැමිණිලි තුනක් ලැබී තිබූ අතර එම පැමිණිලිවලින් අභිචෝදනා කර ඇත්තේ සියයට එකකට වඩා අඩු පැමිණිලි ගණනකටය. මෙම පනතේ වසර 25ක කාලය තුළ දණ්ඩනය නියම වී ඇත්තේ වරදකරුවන් 9කට පමණි. වධහිංසාවෙන් දිවි ගලවා ගත් අය සහ ඔවුන්ගේ පවුල් සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති වෛද්‍ය, මානසික සමාජීය හෝ රාජ්‍ය අනුග්‍රහය දක්වන ආධාරක සේවාවන් නොමැති බව ද වාර්තාව සඳහන් කරයි.

## 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) පනත

ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කරන තවත් නීතියක් වන්නේ ICCPR පනතයි.

ICCPR පනත පනවන ලද්දේ ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති ICCPR හි විධිවිධාන සමහරක් ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම සඳහා ය. මෙම පනතේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම සඳහා පෙළඹවීමකට තුඩු දෙන කතාවලින් ආරක්ෂා කිරීමයි.

ICCPR පනතේ 3(1) වගන්තිය:
"කිසිම තැනැත්තෙකු විසින් යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩක්‍රියාවලට පෙළඹවීම සඳහා ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය පැතිරවීම සිදු නොකළ යුතුය."

ICCPR පනත යටතේ තහනම් කර ඇති "වෛරී කථනයේ" විශේෂිත වූ ලක්ෂණ දෙකක් ඇත. පළමුව, (1) ජාතික, (2) වාර්ගික හෝ (3) ආගමික ද්වේශය පැතිරවීම යි.

අවාසනාවකට මෙන්, මෙම පනත මගින් සමාජභාවය මත හෝ වෙනත් විශේෂිත පුද්ගලයන් කෙරෙහි ඇති ද්වේශය තහනම් නොකරයි. දෙවනුව, එය යම් ආකාරයක පෙළඹවීමකට තුඩු දෙන බවයි. තහනම් කර ඇති " පෙළඹවීම්" වර්ග පනතේ ලැයිස්තුගත කර ඇත: (1) වෙනස් කොට සැලකීම, (2) සාහසික ක්‍රියාවන් හෝ (3) වෛරය සඳහා පෙළඹවීම යි. එබැවින්, තහනම් කර ඇත්තේ යම් ආකාරයක "පෙළඹවීම" අඩංගු කථාවන් පමණි.

මූලාශ්‍රය: https://www.veriteresearch.org/2019/06/24/iccpr-act-sri-lanka/

පනතේ දක්වා ඇති ඕනෑම මානව අයිතිවාසිකමක්, විධායක හෝ පරිපාලන ක්‍රියාමාර්ගයක් මගින් උල්ලංඝණය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝණය වීමක් සම්බන්ධයෙන් ඕනෑම පුද්ගලයෙකුට පෙත්සමක් මාර්ගයෙන් මාස තුනක් ඇතුළත මහාධිකරණයට අයදුම් කළ හැකිය. මෙම පනත යටතේ සඳහන් කර ඇති දඬුවම වන්නේ වසර දහයකට නොවැඩි කාලයක් සඳහා දැඩි සිරදඬුවම කි.

## ඇමුණුම

## 1994 අංක 22 දරණ වධහිංසාවට සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය පනත

1. කෙටි ශීර්ෂය

මේ පනත 1994 අංක 22 දරණ වධහිංසාවට සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. වධහිංසා පැමිණවීම වරදක් වන බව

1. වෙනත් යම් තැනැත්තකුට වධහිංසා පමුණුවන යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.
2. (1) වන උප වගන්තිය යටතේ වරදක් වූ වරදක්-

(අ) සිදු කිරීමට තැත් කරන;
(ආ) සිදු කිරීමට අධාර හා අනුබල දෙන;
(ඇ) සිදු කිරීමට කුමන්ත්‍රණය කරන;
යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

3. ලිඛිත නීතිය මඟින් පිළිගත් කවර හෝ ස්වරූපයක දඬුවමකට නිසි බලය ඇති අධිකරණයක ආඥාව අනුව යම් තැනැත්තකු යටත් කිරීම (1) වන උපවගන්තිය යටතේ වරදක් වන ලෙස නොසැලකිය යුතුය.
4. මේ පනත යටතේ වරදකට වරදකරු වන තැනැත්තකු මහාධිකරණය විසින් නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.
5. මේ පනත යටතේ වූ වරදක් 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥෙය වරදක් සහ ඇපදිය නොහැකි වරදක් විය යුතු ය.

3. මේ පනත යටතේ වරදක් සංයුක්ත කරන යම් ක්‍රියාවක්-

(අ) යුද්ධමය තත්තවයක්, යුද්ධමය තර්ජනයක්, අභ්‍යන්තර දේශපාලන අස්ථිරතාවක් හෝ මහජන හදිසි අවස්ථාවක් පවත්නා අවස්ථාවක;
(ආ) උසස් නිලධරයකුගේ හෝ රාජ්‍ය අධිකාරියක නියමයක් මත සිදු කරන ලදැයි යන කරුණ, ඒ වරද සිදුකිරීම සම්බන්ධයෙන් විත්තිවාචකයක් නොවිය යුතු යැයි, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

12. අර්ථ නිරූපණය

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-
"සම්මුතිය" යන්නෙන් 1984 දෙසැම්බර් මස 10 වන දින නිව් යෝර්ක් නගරයේ දී අත්සන් කරන ලද වධදීමට සහ අනිකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීම්වලට එරෙහිව වූ සම්මුතිය අදහස් වේ;
"රජයේ නිලධරයා" යන්නෙන් ජනරජය යටතේ යම් ගෙවීමක් ලබන තනතුරක් දරන තැනැත්තෙක් අදහස් වේ;
"වධදීම" යන්නෙන් ව්‍යාකරණානුකූල වෙනස්වීම් සහ සජාතිය යෙදුම් ඇතුලුව, "වධදීම" යන්නෙන් වෙනත් යම් තැනැත්තකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූ ද-

(අ) පහත දැක්වෙන කාර්යයන් සඳහා,
එනම්:-

i. එකී වෙනත් තැනැත්තාගෙන් හෝ තුන්වන තැනැත්තකුගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබාගැනීම; හෝ
ii. එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වූ ද;
iii. එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු බිය ගැණ්වීම හෝ ඔහුට බල කිරීම සඳහා;

(ආ) වෙනස්කම් කිරීම මත පදනම් වූ වෙනත් හේතුවක් නිසා කරන්නා වූ ද
සෑම අවස්ථාවක දීම රජයේ නිලධරයකු හෝ නිල තත්ත්වයකින් කටයුතු කරන වෙනත් තැනැත්තකු විසින් හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ මුල්වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම නිලධරයාගේ හෝ තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නා වූ ද යම් ක්‍රියාවක් අදහස් වේ.

# සැසිය 04: මානව හිමිකම් සඳහා එක්සත් ජාතීන්ගේ දායකත්වය

***සාකච්ඡාවකින් අනතුරුව සිදු කරන ක්‍රියාකාරකමකි.***

**කාලය**

පැය 1යි

**ඉලක්ක කණ්ඩායම**

සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගීවන්නන් 30

**අරමුණු**

මෙම සැසිය අවසානයේ,

- එක්සත් ජාතීන්ගේ ආයතන හඳුනා ගැනීමට,
- ප්‍රඥප්ති මත පදනම් වූ මානව හිමිකම් යාන්ත්‍රණයන් සහ ගිවිසුම් මත පදනම් වූ මානව හිමිකම් යාන්ත්‍රණයන් අතර වෙනස හඳුනා ගැනීමට,
- ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් දැනගැනීමට,
- මානව හිමිකම් නිරීක්ෂණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ දායකත්වය අවබෝධ කර ගැනීමට

සහභාගීවන්නන්ට හැකි වනු ඇත.

**අවශ්‍ය මෙවලම්**

- ප්‍රොජෙක්ටරය සහ තිරය
- Flip chart කඩදාසි සහ මාර්කර් පෑන්
- ගම්
- ඇමුණුමේ මුද්‍රිත පිටපත්

**සකස් කිරීම**

- PPT Slides
- Flip chart කඩදාසි: Flip chart කඩදාසි තීරු 4කට බෙදන්න. එක් එක් තීරුවේ ඉහළින්ම මාතෘකා ලෙස මේවා ලියන්න: එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මගින් පිහිටුවන ලද ආයතන, ප්‍රඥප්ති මත පදනම් වූ යාන්ත්‍රණ, මානව හිමිකම් ගිවිසුම් සහ ගිවිසුම් මත පදනම් වූ යාන්ත්‍රණ.
- සැසි සැලැස්ම අවසානයේ ඇති ඇමුණුම මුද්‍රණය කර, සහභාගීවන්නන් අතර බෙදා හැරීමට සෑම අයිතමයක්ම කපා වෙන් කර සූදානම් කරන්න.

**පියවර:**


- ඇමුණුමේ ඇති කපා වෙන් කළ අයිතමයන් සහභාගීවන්නන් අතර බෙදාහරින්න.
- සහභාගීවන්නන්ට තම අයිතමය අයත් වන්නේ කුමන කාණ්ඩයටද යන්න (flip chartහි ඇති කාන්ඩ 4 අතුරින්) හඳුනා ගැනීමට හැකි වන පරිදි හොඳින් සවන් දෙන ලෙස උපදෙස් දෙන්න.
- PPT Slides ආධාරයෙන් දේශනය පවත්වන්න. සටහන් පහත දක්වා ඇත. සහභාගීවන්නන්ට ඔවුන්ගේ කඩදාසි flip chart හි ඇලවීමට අවස්ථාවක් ලබා දීම සඳහා නියමිත වේලාවට දේශනය නවත්වන්න.
- සහභාගීවන්නන්ට ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දීම සඳහා නියමිත වේලාවට දේශනය නවත්වන්න.
- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් තීරණය කරන ලද නඩු ඇති කොටස වෙත පිවිසෙන විට, ප්‍රතිඵලය අනුමාන කිරීමට සහභාගීවන්නන්ට අවස්ථාවක් ලබා දෙන්න.
- සැසිය අවසානයේ දී, සම්පූර්ණ කරන ලද flip chart පරීක්ෂා කිරීමට සහභාගීවන්නන්ට ආරාධනා කරන්න

## සටහන්

UDHR මගින් සියලුම මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්ති 30ක් දක්වා ඇත. කෙසේ වෙතත්, මෙම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට ක්‍රමයක් නොතිබුණි. එබැවින් මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන් විසින් ඇතැම් බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් සකස් කරන ලදී.

මෙම මානව හිමිකම් යාන්ත්‍රණයන්ගෙන් සමහරක් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙන් බලය ලබා ගෙන ඇත. ඔවුන් මානව හිමිකම් පිළිබඳ පුළුල් වූ අධිකාරියක් ගොඩනගා ගෙන ඇති අතර අසීමිත වූ ප්‍රේක්ෂක පිරිසක් ආමන්ත්‍රණය කරයි. 1945 දී සිදු වූ එක්සත් ජාතීන්ගේ උපත පිළිබඳව පෙර පැවති සැසියේදී, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය පිළිබඳව ද කෙටියෙන් සාකච්ඡා කරන ලදී. එය එක්සත් ජාතීන්ගේ ආරම්භක ලියවිල්ල වේ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මගින් එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන ලෙසඃ මහා මණ්ඩලය (මහා මන්ත්‍රණ සභාව), ආරක්ෂක මණ්ඩලය, ආර්ථික හා සමාජීය මණ්ඩලය, භාරකාරත්ව මණ්ඩලය, අන්තර්ජාතික අධිකරණය සහ ලේකම් කාර්යාලය ස්ථාපිත කර ඇති අතර, එක් එක් ආයතනවල බලතල සහ කර්තව්‍යයන් ද දක්වා ඇත.

The six principal organs of the UN, as established by the Charter of the United Nations, are:




එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙන් බලය ලබා ගන්නා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණ හඳුන්වනු ලබන්නේ ප්‍රඥප්ති මත පදනම් වූ ආයතන ලෙස යි.

## ප්‍රඥප්ති මත පදනම් වූ යාන්ත්‍රණ

### 1. මානව හිමිකම් කවුන්සිලය

මානව හිමිකම් කවුන්සිලයෙහි පළමු රැස්වීම 2006 ජූනි මස 19 දින පැවැත්විණි. වසරකට සති 10 ක්, ජිනීවා හි රැස්වන මෙම අන්තර් රාජ්‍ය ආයතනය, තේරී පත් වූ එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 47 කින් සමන්විත වන අතර ඔවුන් මූලික වසර 3 ක කාලයක් සේවය කරන අතර අඛණ්ඩව අවුරුදු වැඩි කාලයක් තේරී පත් විය නොහැක. මානව හිමිකම් කවුන්සිලය යනු අපයෝජනයන්, අසමානතාවයන් සහ වෙනස් කොට සැලකීම් වැළැක්වීමට, වඩාත් අවදානමට ලක්විය හැකි අය ආරක්ෂා කිරීමට සහ අපරාධකරුවන් හෙළිදරව් කිරීමට බලය ලත් සංසදයකි.

මානව හිමිකම් කවුන්සිලය යනු OHCHR (මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය) වෙතින් වෙන් වූ ආයතනයකි. මෙම වෙනස හටගන්නේ මහා මණ්ඩලය විසින් ඔවුන්ට ලබා දුන් වෙනස් අධිකාරීන් නිසාය. එසේ වුවද, OHCHR මානව හිමිකම් කවුන්සිලයේ රැස්වීම් සඳහා සැලකිය යුතු සහයෝගයක් සපයන අතර කවුන්සිලයේ සාකච්ඡා සඳහා පසු විපරම් කිරීම කරයි.

2007 දී කවුන්සිලය විසින් මානව හිමිකම් ආරක්ෂා කිරීම අරමුණු කරගත් ක්‍රියා පටිපාටින් සහ යාන්ත්‍රණයන් 3 ක් සම්මත කරනු ලැබුවේය.

- විශ්ව කාලාන්තර සමාලෝචනයඃ සියලුම එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල මානව හිමිකම්වල තත්ත්වයන් තක්සේරු කරන යාන්ත්‍රණය යි.
- උපදේශක කමිටුවඃ කවුන්සිලයේ "චින්තන ටැංකිය" ලෙස ක්‍රියා කරමින්, තේමාත්මක මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් විශේෂඥ දැනුම සහ උපදෙස් ලබා දෙයි.

- පැමිණිලි පටිපාටිය: මානව හිමිකම් උල්ලංඝණය කිරීම් කවුන්සිලයේ අවධානයට යොමු කිරීමට පුද්ගලයන්ට සහ සංවිධානවලට ඉඩ සලස්වයි.

මානව හිමිකම් කවුන්සිලය SOGIE පිළිබඳව අන්තර් රාජ්‍ය රැස්වීම් සහ විවාදයන් රාශියක් පවත්වා ඇත. එය ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම් පිළිබඳව නොයෙකුත් අවස්ථාවන්වල දී සැලකිල්ලට ලක් කර ඇති අතර, 2016 දී එම ගැටලුව පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම සඳහා ස්වාධීන විශේෂඥයෙකු පත් කර ඇත. සාමාජික රටවල සැලකිය යුතු බහුතරයක් (115) ද විශ්ව කාලාන්තර සමාලෝචනයේ අංගයක් ලෙස LGBTI පුද්ගලයින්ට සිදුවන ප්‍රචණ්ඩත්වයට සහ වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීමට කැපවීම් කර ඇත.

2011දී සහ 2014 දී මානව හිමිකම් කවුන්සිලය LGBT පුද්ගලයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම් සම්බන්ධයෙන් සිදු කළ යෝජනා සම්මත කර, මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගෙන් වාර්තා ඉල්ලා සිටියේය. 2012දී සහ 2015 දී ප්‍රකාශයට පත් කරන ලද මහ කොමසාරිස්වරයාගේ වාර්තා දෙක, පිළිවෙළින්, සෑම ප්‍රදේශයකම LGBTI පුද්ගලයන් වෙත, රැකියාවේදී, සෞඛ්‍ය සේවාවන් වලදී සහ අධ්‍යාපනය තුළ සහ අපරාධකරණය සහ ඝාතන හෝ වන ඉලක්කගත ශාරීරික පහරදීම් දක්වා සිදුකරන ලද විධිමත් ප්‍රචණ්ඩත්වයේ සහ වෙනස් කොට සැලකීමේ රටාවක් පෙන්වා දෙන ලදී.

## 2. විශේෂ ක්‍රියා පටිපාටි (Special Procedures)

විශේෂ ක්‍රියා පටිපාටි යනු මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාව විසින් පිහිටුවන ලද සහ මානව හිමිකම් කවුන්සිලය විසින් කිසියම් රටක තත්ත්වයන් හෝ ලෝකයේ සෑම ප්‍රදේශයකම තේමාත්මක ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා වගකීම භාර ගන්නා ලද යාන්ත්‍රණය යි.

විශේෂ ක්‍රියා පටිපාටි යනු, විශේෂ වාර්තාකරුවෙකු හෝ ස්වාධීන විශේෂඥයෙකු වන තනි පුද්ගලයෙක් එසේ නැතහොත්, ක්‍රියාකාරී කණ්ඩායමකි. ඔවුන් මානව හිමිකම් කවුන්සිලය විසින් පත් කරන ලද, ස්වේච්ඡා පදනමක් මත රාජකාරී සිදුකරනා, කීර්තිමත් වූ ස්වාධීන විශේෂඥයන් වේ.

සාමාන්‍යයෙන් විශේෂ ක්‍රියා පටිපාටි මඟින් බලතල දරන්නන්ගෙන් (mandate holders) ඉල්ලා සිටින්නේ, රටකට ලැබෙන බලතල (country mandates) යනුවෙන් හඳුන්වනු ලබන නියමිත රටවල හෝ ප්‍රදේශවල මානව හිමිකම් තත්ත්වයන් (උදාහරණයක් ලෙස මියන්මාරය) හෝ තේමාත්මක බලතල (thematic mandates) යනුවෙන් හඳුන්වනු ලබන ලෝකයේම යම් යම් ගැටලුකාරී තත්වයන් (උදාහරණ ලෙස, වධහිංසා පැමිණවීම, SOGI ආදිය) හෝ පිළිබඳව පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම, උපදෙස් දීම සහ ප්‍රසිද්ධියේ වාර්තා කිරීම යි. සියල්ලෝම ඔවුන්ගේ සොයාගැනීම් සහ නිර්දේශ පිළිබඳව මානව හිමිකම් කවුන්සිලයට වාර්තා කරන අතර තවත් බොහෝමයක් මහා මණ්ඩලයට ද වාර්තා කරති. මානව හිමිකම් පිළිබඳ ලේඛණයක් අපරානුමත කිරීමකින් තොරව, සෑම රටකම ගැටළු ආමන්ත්‍රණය කල හැකි බැවින්, ඇතැම් මානව හිමිකම් ගැටළු පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කරන එකම යාන්ත්‍රණය මෙය වේ.

### SOGI පිළිබඳ ස්වාධීන විශේෂඥයා (Independent Expert on SOGI)

2016 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් 32/2 නමැති යෝජනාව හරහා, ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට සහ වෙනස් කොට සැලකීමට එරෙහිව ආරක්ෂාව සැපයීම පිළිබඳ ස්වාධීන විශේෂඥයකුගේ (IE SOGI) අධිකාරියක් (mandate) , නිර්මාණය කරන ලදී. 2019 ජුනි මාසයේදී, 41/18 යෝජනාව හරහා මානව හිමිකම් කවුන්සිලය මෙම බලතල අලුත් කරන ලදී.

වැඩ කරන ආකාරය: සංචාරයන්, පුද්ගල සන්නිවේදනය, පර්යේෂණ

SOGI පිළිබඳ ස්වාධීන විශේෂඥයා අනුගමනය කරන්නේ ඡේදනීය වන (intersectional) ප්‍රවේශයකි. මූලික හේතූන් විශ්ලේෂණය කිරීම සඳහා ඓතිහාසික, සමාජ-සංස්කෘතික, දේශපාලන සහ මානව විද්‍යාත්මක ඇතුළු සියුලු සාධක වල විවිධකාර මිනුම් තක්සේරු කිරීම අවශ්‍ය බව ස්වාධීන විශේෂඥ විශ්වාස කරයි.එමඟින් සමාජභාවය, ලිංගිකත්වය සහ ලිංගික ආශාව සම්බන්ධයෙන්,යම් ස්ථානයක සහ යම් වේලාවක, සම්මතයක් ලෙස සලකනු ලබන දේ සහ එහි ප්‍රතිඵලයක් ලෙස වරප්‍රසාද, හෝ ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීමේ අත්දැකීම් පිළිබඳව අවබෝධයක් ලබා දෙයි.

පුද්ගලයන්ට සහ සංවිධානවලට SOGI පිළිබඳ ස්වාධීන විශේෂඥයා වෙත පෙත්සම් ගොනු කළ හැක. එවිට SOGI මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට සිදුවන උල්ලංඝණය කිරීම් වාර්තා කිරීමට සහ "චෝදනා කිරීමේ ලිපි" (allegation letters) හෝ "හදිසි ක්‍රියාමාර්ග" (urgent actions) හරහා පිළියම් සෙවීමට හැකිය. SOGI පිළිබඳ ස්වාධීන විශේෂඥයා අදාළ රාජ්‍යයට ලිපියක් යවා ගැටලුව නිල වශයෙන් මතු කරනු ඇත.

## ගිවිසුම් මත පදනම් වූ යාන්ත්‍රණ

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගිවිසුම් මගින් බලය ලබා ගන්නා මානව හිමිකම් යාන්ත්‍රණ ද සකස් කරන ලදී. ගිවිසුම් යනු රාජ්‍ය පාර්ශවයන් විසින් අපරානුමත කිරීමෙන් අනුමත කර ඇති මානව හිමිකම් ලේඛන වේ. එනම්, යම් ගිවිසුමකට බැඳී සිටීමට එකඟ වූ පසු, ගිවිසුමේ පිළිගත් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට බැඳීමක් ඇති බවයි.

මූලික ජාත්‍යන්තර මානව හිමිකම් ලේඛන 9 ක් ඇත.

1. ICERD - සියලු ආකාරයේ වාර්ගික වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය
2. ICCPR - සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය
3. ICESCR - ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය
4. CEDAW - ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාරයේ වෙන්ස්කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය
5. CAT - වධහිංසා හා වෙනත් කුරිරු, අමානුෂික හෝ පහත් කොට සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය
6. CRC - ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය
7. ICMW - සියලුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය
8. CPED - බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියලුම පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ අන්තර් ජාතික සම්මුතිය
9. CRPD - ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

මෙම සෑම ලේඛනයක් මගින්ම එහි රාජ්‍ය පාර්ශවයන් විසින් ගිවිසුම් විධිවිධාන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පිහිටුවා ඇත. සමහර ගිවිසුම් මගින් විශේෂිත වූ ගැටළු ආමන්ත්‍රණය කරනු ලබන විකල්ප ප්‍රොටෝකෝල (Optional Protocols) අඩංගු වේ. වධහිංසාවට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටෝකෝලය මගින් විශේෂඥ කමිටුවක් ද පිහිටුවා ඇත.

ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් රාජ්‍ය පාර්ශවයන් විසින් ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කරනු ලබන මානව හිමිකම් ගිවිසුම් ආයතන (human rights treaty bodies) දහයක් ඇත.

1. වාර්ගික වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ කමිටුව (CERD)
2. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CESCR))
3. මානව හිමිකම් කමිටුව (CCPR)
4. කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ කමිටුව (CEDAW)
5. වධහිංසාවට එරෙහි කමිටුව (CAT)
6. ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRC)
7. සංක්‍රමණික කම්කරුවන් පිළිබඳ කමිටුව (CMW)
8. වධහිංසා වැළැක්වීමේ අනුකමිටුව (SPT)
9. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRPD)
10. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ කමිටුව (CED)

මෙම කමිටු මගින් රාජ්‍ය පාර්ශවයන්ට ඔවුන්ගේ මානව හිමිකම් පිළිබඳ තත්ත්වය වාර්තා කිරීමට වරින් වර ආරාධනා කරයි. Shadow වාර්තා ඉදිරිපත් කිරීම සඳහා ප්‍රාදේශීය සිවිල් සංවිධානවලට අවස්ථාව සලසා දී ඇත. රාජ්‍ය පාර්ශව වල වාර්තා සහ Shadow වාර්තා සලකා බැලීමෙන් අනතුරුව, කමිටු මගින් අවසාන නිරීක්ෂණ සිදු කරනු ලබයි.

මෙම ගිවිසුම් මගින් පිහිටුවන ලද ඇතැම් කමිටු LGBT අයිතිවාසිකම් සහ අදාළ ගිවිසුමේ ආමන්ත්‍රණය කර ඇති ගැටළු සමඟ ජේදනය වීම පිළිබඳව අදහස් දක්වා ඇත. මානව හිමිකම් කමිටුව, ESCR කමිටුව, CEDAW කමිටුව සහ CRC කමිටුව මෙයට උදාහරණ වේ.

ICCPR හි පිළිගෙන ඇති අයිතිවාසිකම් බලාත්මක කිරීමට උත්සාහ කරන මානව හිමිකම් කමිටුව, LGBTIQ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ නඩු විභාග කර ඇත.

**මානව හිමිකම් කමිටුවේ තීරණ**

*Toonen v Australia* (1994) නඩුවේ දී මානව හිමිකම් කමිටුව විසින් තීන්දු කලේ, සමරිසි සබඳතා අපරාදයක් ලෙස සැලකීම මඟින්, ICCPR හි 17 වන වගන්තිය මඟින් ආරක්ෂා කරනු ලබන පෞද්ගලිකත්වයට ඇති නිදහසට සහ 2.1 වගන්තිය මඟින් ආරක්ෂා කරනු ලබන වෙනස් කොට සැලකීමෙන් වැළකීමට ඇති නිදහසට බාධාවක් වන බවයි.

**ICCPR හි විධිවිධාන**

**2(1) වන වගන්තිය:**
මේ සම්මුතියට ඇතුළත් ඒ ඒ රාජ්‍ය පාර්ශවකරුවෝ මෙම සම්මුතියෙහි පිළිගැනෙන අයිතිවාසිකම්වලට ගරු කිරීමටත් වර්ගය, වර්ණය, ලිංගිකත්වය, භාෂාව, ආගම, දේශපාලන ආදී වෙනත් කවර භේදයක් හෝ ජාතික හෝ සමාජ සම්භවය, දේපල, උපත හෝ වෙනත් තත්වයන් කෙරෙහි කිසිඳු විශේෂයක් නොමැතිව සිය දේශසීමාව ඇතුළත ද සිය අධිකරණ බල සීමාවට යටත්ව ද සියලුම පුද්ගලයන්ට උරුම වන බවට වග බලා ගැනීමටත් පොරොන්දු වෙති.

**17 වන වගන්තිය:**

1. කිසිම තැනැත්තකු ඔහුගේ රහස් භාවය, පවුල, නිවස හෝ ලිපි ගනු දෙනුව සම්බන්ධව ඇඟිලි ගැසීමකට භාජනය නොකල යුතුය. එසේම නම්බුව සහ කීර්ති නාමය නීති විරෝධී ප්‍රහාරයන්ට භාජන නොකළ යුතුය.
2. එවැනි ඇඟිලි ගැසීම් හෝ ප්‍රහාරයන්ට විරුද්ධව නීතියේ රැකවරණ ලැබීමට සෑම කෙනෙකුටම හිමිකම් ඇත්තේය.

**26 වන වගන්තිය:**
සියලුම තැනැත්තෝ නීතිය ඉදිරියෙහි එක සමාන වන්නාහ. තවද කිසිම ප්‍රභේදයකින් තොරව නීතියේ සමාන රැකවරණය ලැබීමට හිමිකම් ඇත්තෝය. මේ සම්බන්ධයෙන් ඕනෑම වෙනස්කමක් නීතියෙන් තහනම් විය යුතු අතර, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත, ජාතික හෝ සමාජීය සම්භවය, දේපල, උත්පත්තිය හෝ වෙනත් තත්ත්වයන් යන යම් හේතුවක් මත වෙනස්කම් කිරීමට විරුද්ධව සමාන සහ කාර්යසාධක රැකවරණය නීතියෙන් සහතික කළ යුතුය.

ටූනන් යනු ටස්මේනියානු ප්‍රාන්තයේ ජීවත් වන සමරිසි ඔස්ට්‍රේලියානු ජාතිකයෙකි. ඔහු තර්ක කලේ ටස්මේනියානු දණ්ඩ නීති සංග්‍රහයේ, අස්වාභාවික කාමුක සංසර්ගය සහ අශිෂ්ට ක්‍රියාවන් යනුවෙන් සඳහන් කරන 122 සහ 123 යන වගන්ති ඔහුගේ අයිතිවාසිකම් උල්ලංඝණය කරන බවයි. (ICCPRහි 2(1) වගන්තියේ වෙනස් කොට සැලකීමෙන් ආරක්ෂා වීම, 17 වන වගන්තියේ පෞද්ගලිකත්වයට ඇති නිදහස සහ 26 වන වගන්තියේ සඳහන් වෙනස්කොට සැලකීමකින් තොරව නීතියේ ආරක්ෂාව ලැබීමේ අයිතිය.) මෙහිදී කමිටුව විසින් 2(1) සහ 17(1)) යන වගන්ති උල්ලංඝණය වන බව තීරණය කල අතර, 26 වන වගන්තිය උල්ලංඝණය වන බව තීරණය නොකරන ලදී. කමිටුව තීරණය කලේ, පෞද්ගලිකත්වයට ඇති නිදහස ආරක්ෂා කරනු ලබන්නේ ICCPR හි 2(1) යන වගන්තිය මඟින් වන අතර , 2(1) වගන්තියේ සඳහන් "ලිංගිකත්වය " අර්ථනිරූපණය සඳහා "ලිංගික දිශානති"යද ඇතුළත් වන බවයි.

**ICCPRහි 2(1) සහ 26 යන වගන්තීන් හි සඳහන් "වෙනත් තත්ත්වයන්" යන විධිවිධානය භාවිතයේදී 'ලිංගිකත්වය' යටතේ ලිංගික දිශානතිය ඇතුළත් කිරීමට වඩා හොඳ බව තර්ක කර ඇත.**

Young v Australia (2003) යන නඩුවේදී, යංග් මහතා යුද ප්‍රවීණයෙකුගේ විශ්‍රාම වැටුප ලබාගැනීම සඳහා ඉල්ලුම් කළේය. ඊට අදාළ දෙපාර්තමේන්තුව ඔහුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළේ ඔහුගේ අවුරුදු 38ක් වයසැති සහකරු ද පිරිමි වූ බැවිනි. නීතියට අනුව, යම් යුවලකගේ එක් අයෙක් විරුද්ධ ලිංගයේ විය යුතුය. ඔහුගේ ලිංගික දිශානතිය මත පදනම් වී වෙනස්කම් සිදු කරන බවට යංග් මහතා පැමිණිලි කළේය. මෙහිදී HRC මඟින් තීරණය කරන ලැබුවේ, ඔහුගේ ලිංගිකත්වය හෝ ලිංගික දිශානතිය මත පදනම් වී විශ්‍රාම වැටුප ප්‍රතික්ෂේප කිරීම මඟින් රජය විසින් ICCPR හි 26 වැනි වගන්තිය උල්ලංඝණය කර ඇති බවයි.

ඉහත සඳහන් කල ප්‍රඥප්ති මත පදනම් වූ මානව හිමිකම් යාන්ත්‍රණයන්ට සහ ගිවිසුම් මත පදනම් වූ මානව හිමිකම් යාන්ත්‍රණයන්ට අමතරව, එක්සත් ජාතීන්ගේ ලේකම් කායාලයේ දෙපාර්තමේන්තුවක් වන එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) ද , LGBT ප්‍රජාවගේ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා ඉමහත් දායකත්වයක් සපයා ඇත.

**OHCHR හි දායකත්වය**

2012 සහ 2019 දී OHCHR විසින් LGBT අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යය පාර්ශවයන් විසින් ඇති කරගත යුතු මූලික ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ බැඳීම් පහක් දක්වමින්, Born Free and Equal:Sexual Orientation and Gender Identity in International Human Rights Law යන මැයෙන් පොත් පිංචක් ප්‍රකාශයට පත් කරන ලදී.

1. සමරිසි භීතිකාව සහ සංක්‍රාන්තික සමාජභාවී භීතිකාව  නිසා ඇති වන හිංසනයන්ගෙන් පුද්ගලයන් ආරක්ෂා කිරීම,
2. LGBTIQ ප්‍රජාවන්ට සිදු වන වධහිංසා පැමිණවීම සහ කුරිරු, අමානුෂික සහ පහත් ලෙස සැලකීම වැළැක්වීම,
3. සමරිසි භාවය සාපරාධී බවින් තොර කිරීම,
4. ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය  මත පදනම්ව වෙනස් කොට සැලකීම වැලැක්වීම,
5. LGBTIQ ප්‍රජාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, සමාගමයේ අයිතිය සහ සාමකාමීව රැස්වීමට ඇති නිදහසට ගරු කිරීම.

## Annex:

| |
|---|
| ICERD - සියලු වාර්ගික වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| ICCPR - සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| ICESCR - ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| CEDAW - කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් ඉවත් කිරීම පිළිබඳ සම්මුතිය |
| CAT - වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය |
| CRC - ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය |
| ICMW- සියලුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| CPED - බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියලුම පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය |
| CRPD - ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය |
| වාර්ගික වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ කමිටුව (CERD) |
| ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CESCR) |
| මානව හිමිකම් කමිටුව (CCPR) |
| කාන්තාවන්ට එරෙහිව වෙනස් කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව (CEDAW) |
| වධහිංසාවට එරෙහි කමිටුව (CAT) |
| ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRC) |
| සංක්‍රමණික කම්කරුවන් පිළිබඳ කමිටුව (CMW) |
| වධහිංසා වැළැක්වීමේ අනුකමිටුව (SPT) |
| ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRPD) |
| බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් පිළිබඳ කමිටුව ((CED) |
| විශේෂ ක්‍රියා පටිපාටිය - විශේෂ වාර්තාකරු |
| විශේෂ ක්‍රියා පටිපාටිය - ස්වාධීන විශේෂඥ |
| විශේෂ ක්‍රියා පටිපාටිය - ක්‍රියාකාරී කණ්ඩායම |
| මානව හිමිකම් කවුන්සිලය |
| විශ්ව කාලාන්තර සමාලෝචනය |

| |
|---|
| උපදේශක කමිටුව |
| මානව හිමිකම් කවුන්සිලයේ පැමිණිලි පටිපාටිය |
| එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය |
| එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය |
| එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලය |
| එක්සත් ජාතීන්ගේ භාරකාර මණ්ඩලය |
| අන්තර්ජාතික අධිකරණය |
| එක්සත් ජාතීන්ගේ මහලේකම් කාර්යාලය |

# සැසිය 05: ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වීම

*ඉදිරිපත් කිරීම සහ Q &A*

**කාලය**
විනාඩි 45 යි

**ඉලක්ක කණ්ඩායම**
සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගීවන්නන් 30

**අරමුණු**
මෙම සැසිය අවසානයේ දී,

- ලංකාව මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වීම සම්බධව විවේචනාත්මකව පරීක්ෂා කිරීමට

සහභාගිවන්නන්ට හැකි වනු ඇත:

**අවශ්‍ය මෙවලම්**
ප්‍රොජෙක්ටරය සහ තිරය

**සකස් කිරීම**
PPT Slides

**පියවර**

- ලංකාව ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් පිළිපැදීම පිළිබඳව ඉදිරි විනාඩි 45 දී සාකච්ඡා කරනු ඇති බව පැහැදිලි කරන්න.
- මානව හිමිකම් සඳහා එක්සත් ජාතීන්ගේ දායකත්වය පිළිබඳව වූ සැසියේදී හඳුනාගත් මූලික ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් සිහිපත් කරන්න.
- ඉදිරිපත් කිරීමට ඉදිරියට කරගෙන යන්න. ඉදිරිපත් කිරීම් සඳහා සටහන් පහත 'සටහන්' කොටසින් සොයා ගත හැක.
- ප්‍රශ්න ඉදිරිපත් කිරීමෙන් සහභාගීවන්නන්ට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දෙන්න.
- සැසිය අවසානයේ දී, සහභාගීවන්නන් මතුකරන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සටහන්**

**ශ්‍රී ලංකාව මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වීම**

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙකු වන අතර, ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් සියල්ලක්ම අපරානුමත කර ඇත. ගිවිසුම්වල ඇති විධිවිධානයන් පිළිපැදීම පිළිබඳව සඳහන් වන, කාලාන්තර රාජ්‍ය වාර්තා අදාළ ගිවිසුම් කමිටු වෙත ඉදිරිපත් කිරීමේ වගකීම ද ශ්‍රී ලංකාවට ඇත. විශ්ව කාලාන්තර සමාලෝචනයේදී මානව හිමිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව තක්සේරු කරනු ලබයි.

**විශ්ව කාලාන්තර සමාලෝචනය යනු කුමක්ද?**

විශ්ව කාලාන්තර සමාලෝචනය (UPR) යනු එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රටවල මානව හිමිකම් වාර්තා සමාලෝචනය කිරීම ඇතුළත් ක්‍රියාවලියකි. UPR යනු මානව හිමිකම් කවුන්සිලයේ අනුග්‍රහය යටතේ රාජ්‍යයන් විසින් මෙහෙයවන ක්‍රියාවලියක් වන අතර, එමගින් සෑම රාජ්‍යයකටම තම රටේ මානව හිමිකම් තත්ත්වයන් වැඩිදියුණු කිරීමට සහ ඔවුන්ගේ මානව හිමිකම් පිළිබඳ බැඳීම් ඉටු කිරීමට තමා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාදැයි ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙයි.

කවුන්සිලයේ එක් ප්‍රධාන අංගයක් ලෙස, UPR හි අරමුණ වන්නේ රටවල්වල මානව හිමිකම් තත්ත්වයන් තක්සේරු කිරීමේදී සෑම රටක්ම සමානව සැලකීම සහතික කිරීම සඳහා ය. මෙම යාන්ත්‍රණයේ පරම අරමුණ වන්නේ සෑම

රටකම මානව අයිතිවාසිකම් වල තත්ත්වය වැඩිදියුණු කිරීම සහ මානව හිමිකම් උල්ලංඝණය වීමක් සිදු වූ වටදී ඒවාට පිළියම් යෙදීමයි. දැනට මේ ආකාරයේ වෙනත් විශ්වීය යාන්ත්‍රණයක් නොමැත.

මූලාශ්‍රයඃ https://www.ohchr.org/en/hrbodies/upr/pages/uprmain.aspx

ලංකාවේ මීළඟ විශ්ව කාලාන්තර සමාලෝචනයේ සිව්වන චක්‍රය තිබෙන්නේ 2021 ජනවාරි සිට පෙබරවාරි අතරය. රාජ්‍ය වාර්තා පිළිගැනීමේ අවසන් දිනය 2022 ඔක්තෝබර් වේ.

### මානව හිමිකම් කවුන්සිලයේදී UPR අතරතුර දී (2017)

විශ්ව කාලාන්තර සමාලෝචනයේ සිව්වන චක්‍රයේ දී, ශ්‍රී ලංකාව 2017 නොවැම්බර් මාසයේදී සමාලෝචනය කරන ලදී. 28 වැනි UPR ක්‍රියාකාරී කණ්ඩායම් සැසියන්වල දී, ශ්‍රී ලංකාවට SOGIESC සම්බන්ධ නිර්දේශයන් 10 ක් ලැබුණි.

ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෝ නිර්දේශ 3කට සහය දුන් අතර නිර්දේශ 7ක් සටහන් කළහ. උපදේශන අතරතුර දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීමේ පොරොන්දුව සහ ලිංගික දිශානතිය සහ සමාජභාවය මත පදනම්ව, ජීවත්වීමේ අයිතිය සහ වෙනස් කොට නොසැලකීම වැනි නිශ්චිත අයිතිවාසිකම් ඇතුළත් ශක්තිමත් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් සකස් කිරීමේ පොරොන්දුව ඇතුළු සංවර්ධනයන් කිරීම රජය විසින් ඉස්මතු කරන ලදී.

ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ අඩංගු සියලුම වැරදි ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය ප්‍රතිසංස්කරණය කිරීමට රජය කැපවන අතර, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කල 2017-2021 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම මඟින් එම කැපවීම පිළිබිඹු වේ.

තවදුරටත් කියවීමඃ
https://ilga.org/downloads/28TH_UPR_WORKING_GROUP_SESSIONS_SOGIESC_RECOMMENDATIONS.pdf

### මානව හිමිකම් කමිටුව (2014)

2014 දී එවකට ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව ඉදිරියේ පවසා සිටියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාව යටතේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය පදනම් කරගෙන වෙනස් කොට නොසැලකීම ඇතුළත් වන බවයි.

මානව හිමිකම් කමිටුව ශ්‍රී ලංකාවට ඉදිරිපත් කල නිර්දේශය වන්නේ, ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය පදනම් කරගෙන වෙනස් කොට නොසැලකීම පැහැදිලිව ඇතුළත් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීමට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සලකා බලන ලෙස යි. සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්තික සමාජභාවීය සහ අන්තර් ලිංගික පුද්ගලයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමෙන් වැළකීමට ගන්නා පියවර ශක්තිමත් කිරීම මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණු කිරීම් ශක්තිමත් කරන ලෙස ද නිර්දේශ කර ඇත. (අවසාන නිරීක්ෂණ 2014, 8 වැනි ඡේදය)

### CEDAW කමිටුවේ නිර්දේශය (2017)

ශ්‍රී ලංකාව පිළිබඳ අටවැනි කාලාවර්තක වාර්තාව සම්බන්ධයෙන් CEDAW කමිටුවේ අවසාන නිරීක්ෂණවලට පහත නිරීක්ෂණ ඇතුළත් විය.

> 10. දැනට සිදුවෙමින් පවතින ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය කමිටුව අගය කරයි. කෙසේ වෙතත්, එම ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ සීමිත සහභාගීත්වය පිළිබඳව එය තවදුරටත් කණස්සලු සහගතව සිටී. සමානාත්මතාවට ඇති අයිතිය යටතේ ලිංගික දිශානතිය මත පදනම්ව වෙනස් කොට සැලකීම තහනම් කෙරෙන්නේද යන්න සම්බන්ධයෙන් යම් අවිනිශ්චිතාවයක් පැහැදිලි කිරීම පිණිස, සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය වෙනස් කොට නොසැලකීම සඳහා පදනමක් ලෙස විශේෂිතව ඇතුළත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කාරක සභාවේ යෝජනාව සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශවයේ ප්‍රතිචාරය කමිටුව සටහන් කර ගනී. කෙසේ වෙතත්, රාජ්‍ය පාර්ශවය මෙම යෝජනාව පිළිගැනිම සම්බන්ධයෙන් අපැහැදිලි බවක් පවතින බව කමිටුව නිරීක්ෂණය කරයි.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාව කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ සමානාත්මතාව සහතික කරන නමුත්ඃ
(අ) ප්‍රඥප්තියෙහි 1 වැනි වගන්තිය අනුව අවශ්‍ය වන පරිදි එය සෘජුව හෝ වක්‍රව කාන්වාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම නොකරන බවත්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) ව්‍යවස්ථාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලාත්මක වීමට පෙර පැවති වෙනස් කොට සැලකීම සිදුකරන නීති අධිකරණය මඟින් සමාලෝචනයට ඉඩ ප්‍රස්ථා නොලබන බවත්;
(ඇ) නීති සහ ප්‍රතිපත්ති ඡේදනීය වෙනස් කොට සැලකීම ආමන්ත්‍රණය නොකරන බවත්;
කනස්සල්ලෙන් යුතුව නිරීක්ෂණය කරයි.

11. පැහැදිලිව නිශ්චය කරන ලද කාලරාමුවක් තුළ රාජ්‍ය පාර්ශවය පහත සඳහන් දේ ඉටු කළ යුතු බවට කමිටුව නිර්දේශ කරයි:

(ආ) ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය වෙනස් කොට සැලකීම සඳහා තහනම් පදනමක් ලෙස ඇතුලත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කාරක සභාව කර ඇති යෝජනාවට නිසි සැලකිල්ල ලබා දීම;

### Rosanna Flamer-Caldera v Sri Lanka නඩුවේ CEDAW කමිටු තීරණය (මාර්තු (2022)

- දණ්ඩ නීති සංග්‍රහයේ 365A වගන්තිය යටතේ කාන්තාවන් අතර කැමැත්ත මත පවතින සමරිසි ලිංගික ක්‍රියාකාරකම් සාපරාධීකරණය කිරීම කෑ්උ සම්මුතිය යටතේ වෙනස් කොට නොසැලකීමට ඇති අයිතිය උල්ලංඝණය කරන බව කමිටුව සොයා ගත්තේය.
- කාන්තාවන් අතර කැමැත්ත මත පවතින සමරිසි ලිංගික හැසිරීම් නිර්සාපරාධීකරණය කරන ලෙස ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටියේය.
- ශ්‍රී ලංකා බලධාරීන් විසින් රොසානාව සමාජභාවය පදනම් කරගත් වෙනස් කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වයට ලක් කර ඇති අතර සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිතයක් සඳහා ඇයට ඇති අයිතියට ගරු කිරීමට නීතිමය හෝ වෙනත් ක්‍රියාමාර්ග නොගත් බව කමිටුව තීරණය කළේය.
- ප්‍රචණ්ඩත්වය, වෙනස් කොට සැලකීම සහ සමාජභාවය පිළිබඳ හානිකර ඒකාකෘතිවලට එරෙහිව පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා කැමැත්ත මත පවතින සමරිසි සබඳතා තහනම් කරන නීතීන් ඉවත් කිරීම අත්‍යවශ්‍ය බව කමිටුව ප්‍රකාශ කළේය.
- කාන්තා මානව හිමිකම් ආරක්ෂා කරන්නන් සහ කාන්තා ක්‍රියාකාරීන් සඳහා ආරක්ෂිත සහ හිතකර පරිසරයක් සහතික කිරීම සඳහා නිශ්චිත සහ ඵලදායී පියවර ගන්නා ලෙසත්, තර්ජන, හිරිහැර කිරීම් සහ අපයෝජනයන් නැවැත්වීමට ඉක්මන් හා ඵලදායී පියවර ගන්නා ලෙසත් කමිටුව ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටියේය.
- සමරිසි ලිංගික ක්‍රියාකාරකම් සාපරාධී ලෙස සැලකීම නිසා ඇයව අත්අඩංගුවට ගැනීමට සහ නඩු පැවරීමට අවදානමට ලක්ව ඇති හෙයින්, රොසානාට තමන්ට එල්ල වූ තර්ජන සහ හිරිහැරවලට එරෙහිව පොලිසියට ගොස් පැමිණිලි ගොනු කළ නොහැකි බව කමිටුව සඳහන් කළේය. සම්මුතිය යටතේ, කාන්තාවන්ට රාජ්‍ය ආරක්ෂාව සහ අපරාධ නීතිය හරහා ලබා දෙන පිළියම් සඳහා ප්‍රවේශය තිබිය යුතු අතර එම යාන්ත්‍රණවලට ප්‍රවේශ වීමේදී වෙනස්කම්වලට ලක් නොවිය යුතුය.
- මෙය සුවිශේෂී නඩු තීන්දුවකි (landmark decision).

# සැසිය 06: ඉන්දියානු අත්දැකීම

*ඉදිරිපත් කිරීම සහ Q & A*

**කාලය**
විනාඩි 30

**ඉලක්ක කණ්ඩායම**
සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගිවන්නන් 30කි.

**අරමුණු**
මෙම සැසිය අවසානයේ,

- සමරිසි සහකරුවන් අතර ලිංගික ක්‍රියා නිර්සාපරාධීකරණය කිරීම සඳහා ඉන්දියාව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව

සහභාගීවන්නන්ට දැනගැනීමට හැකි වනු ඇත.

**අවශ්‍ය මෙවලම්**
ප්‍රොජෙක්ටරය සහ තිරය

**සකස් කිරීම**
Slides

**පියවර:**

- ඉදිරි මිනිත්තු 30 තුළ සමරිසි සහකරුවන් අතර ලිංගික ක්‍රියා නිර්සාපරාධීකරණය කිරීමට ඉන්දියාව ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන බව පවසන්න.
- slides භාවිතා කරමින් ඉදිරියට යන්න. ඉදිරිපත් කිරීම සඳහා සටහන් පහත 'සටහන්' කොටසින් සොයා ගත හැක.
- "මෙයින් අදහස් කරන්නේ කුමක්ද?", සහ "ඊළඟට සිදු වූ බව ඔබ සිතන්නේ කුමක්ද?" වැනි ප්‍රශ්න ඉදිරිපත් කිරීමෙන් සහභාගිවන්නන්ට සම්බන්ධ වීමට අවස්ථාව සලසා දෙන්න.
- ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ අධිකරණ පද්ධතියේ සමානකම් සහ වෙනස්කම් ගැන මෙනෙහි කිරීමට සහභාගීවන්නන්ට අවස්ථාවක් ලබා දෙන්න
- සැසිය අවසානයේදී සහභාගීවන්නන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සටහන්

**Navtej Singh Johar v. Union of India**

කැමැත්ත මත පවතින සමරිසි වැඩිහිටි පුද්ගලයන් අතර ලිංගික ක්‍රියා නිර්සාපරාධීකරණය කිරීම පිළිබඳ ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව (2018)

ඉතිහාසය පුරා සමරිසි භාවය ඉන්දියානු උපමහාද්වීපය පුරා ප්‍රචලිත වී ඇති බවත්, 18 වැනි සියවසේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදී ද සමරිසි ප්‍රජාවට කිසිදු ආකාරයකින් පහත් කොට සැලකීමක් සිදු කර නොමැති බවත් ඓතිහාසික සාහිත්‍ය සාක්ෂි පෙන්වා දෙයි. කෙසේ වෙතත්, 1860 දී බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහය මගින් කැමැත්ත මත පවතින වැඩිහිටි පුද්ගලයන් අතර සමරිසි සබඳතා අපරාධයක් බවට පත් කරන ලදී.

| |
|---|
| 377ග අස්වාභාවික අපරාධ: ස්වභාව ධර්මයේ නියමයට පටහැණිව යමින් කවර හෝ පුරුෂයෙකු, ස්ත්‍රියක හෝ සත්ත්වයෙකු සමග ස්වකැමැත්තෙන් මෛථුනයෙහි යෙදෙන ඕනෑ ම කෙනෙකුට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් හෝ ඇතැම් විට වසර දහයක් දක්වා විය හැකි සාමාන්‍ය හෝ බරපතළ සිර දඬුවමක් ද දඩයක් ද නියම කළ යුතු ය. පැහැදිලි කිරීම - මෙම වගන්තිය තුළ විස්තර වන අපරාධය සඳහා අවශ්‍ය කරන කාමුක සංසර්ගය වරද ස්ථාපනය වීමට ගාහනය (ඇතුලු කිරීම) පමණක් වුව ප්‍රමාණවත් ය |

2009 දී, *Naz Foundation v. Govt. of NCT of Delhi*[1] යන සුවිශේෂී නඩු තීන්දුව මඟින් දිල්ලි මහාධිකරණයේ ද්විපුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් තීරණය කළේ, සමරිසි වැඩිහිටි පුද්ගලයන් අතර ලිංගික හැසිරීම අපරාධයක් ලෙස සැලකීම ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරන බවයි. මෙම නඩුව ගොනු කර ඇත්තේ LGBTQ+ ක්‍රියාකාරීන්ගෙන් සැදුම්ලත් සංවිධානයක් වන Naz Foundation විසිනි. මෙම තීන්දුවේ ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාව පුරා කැමැත්ත මත පවතින වැඩිහිටියන් අතර සමරිසි ලිංගික ක්‍රියාකාරකම් නිර්සාපරාධීකරණය කරන ලදී.

කෙසේ වෙතත්, මෙම නඩුව පසුව *සුරේෂ් කුමාර් කෞෂාල් එදිරිව නාස් පදනම්*[2] යන නඩුවේදී ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය  විසින් අවලංගු කරන ලද අතර, එහිදී ද්විපුද්ගල විනිසුරු මඩුල්ල විසින් ඉන්දීය දණ්ඩ නීති සංග්‍රහයේ 377 වගන්තිය නැවත ස්ථාපිත කරන ලදී.

එසේ තිබියදීත්, 2016 දී ඉන්දියානු LGBTIQ+ ක්‍රියාකාරීන් විසින් තවත් නඩුවක් ගොනු කරන ලදී.

2018 සැප්තැම්බර් 6 දින, ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය *Navtej Singh Johar v. Union of India*[3] නඩුවේදී ඒකමතිකව තීන්දු කළේ "සමරිසි වැඩිහිටි පුද්ගලයන් අතර කැමැත්ත මත පවතින ලිංගික හැසිරීම් අපරාධයක් ලෙස සැලකීම" යනුවෙන් සඳහන් වන 377 වගන්තිය ව්‍යවස්ථා විරෝධී බවයි.

377 වැනි වගන්තිය මඟින් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන ව්‍යවස්ථාව (සමානාත්මතාවය) සහ 15 වන ව්‍යවස්ථාව (වෙනස් කොට නොසැලකීම) උල්ලංඝණය කරමින් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජභාවය මත පදනම්ව වෙනස් කොට සලකන ලද බව විනිසුරුවරු සොයා ගත්හ. තවද, 377 වගන්තිය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වැනි ව්‍යවස්තාව යටතේ ඇති ජීවත්වීමේ අයිතිය, අභිමානය සහ පුද්ගලික තේරීමේ අභිමතය, (ජීවත්වීමේ අයිතිය සහ පුද්ගලිකත්වයට ඇති නිදහස) උල්ලංඝණය කරන බව ඔවුහු තීන්දු කළහ. අවසාන වශයෙන්, 19(1)(අ) ව්‍යවස්ථාව යටතේ ඇති ප්‍රකාශනයේ අයිතිය උල්ලංඝණය කරමින් LGBT ප්‍රජාවගේ අනන්‍යතාවය සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීමේ හැකියාව වළක්වන බව ඔවුන් සොයා ගත්හ. මෙම සියලුම නඩු තීන්දු *National Legal Services Authority v. Union of India* (සංක්‍රාන්තික සමාජභාවී අනන්‍යතාවය අධිකරණය විසින් පිළිගෙන ඇත) සහ *Puttaswamy vs Union of India*[4] (පෞද්ගලිකත්වය සඳහා වන මූලික අයිතිවාසිකම අධිකරණය විසින් පිළිගෙන ඇත) යන මෑත කාලීන තීන්දු වෙත යොමු විය.

377) වගන්තිය අර්ධ වශයෙන් ඉවත් කිරීමේදී විනිසුරු මඩුල්ල සුරේෂ් කුමාර් කෞෂාල්ගේ නඩුව අවලංගු කළේය. 377 වගන්තිය මූලික අයිතිවාසිකම් කඩ කරන ආකාරය හඳුනා ගැනීමට සුරේෂ් කෞෂාල් අපොහොසත් වූවා පමණක් නොව, එය තවදුරටත් ව්‍යවස්ථාපිතව අනුමත කළ නොහැකි තාර්කික පදනමක් මත විශ්වාසය තබා ඇති බව විනිසුරු මඩුල්ල සොයා ගත්තේය. 377 වගන්තිය මගින් ඍණාත්මක ලෙස බලපෑනු ලබන්නේ පුරවැසියන්ගෙන් සුළුතරයක් පමණක් බැවින්, අධිකරණය මැදිහත් විය යුතු නැති බව සුරේෂ් කෞෂාල් කුඩා සුළුතර තර්කය (Miniscule minority rationale) භාවිතා කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිංගික දිශානතිය හෝ සමාජභාවය යන කරුණු නොසලකා සියලුම පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සහතික කරයි. අධිකරණය උත්සුක වන්නේ 'ජනප්‍රිය සදාචාරය( popular morality)') නොව 'ව්‍යවස්ථාපිත සදාචාරය' (constitutional morality) ආරක්ෂා කිරීමට ය.

විනිසුරු මිස්රා තමා සහ විනිසුරු ඛාන්විල්කාර් වෙනුවෙන් තීන්දුවක් ලිව්වේය. මෙම තීන්දුවේ දී ස්වයං නිර්ණය සඳහා පුද්ගලයකුට ඇති අයිතිය පිළිබඳව ඔහු අවධාරණය කළේය. 377 වගන්තිය මඟින් පුද්ගලයෙකුට කැමැත්ත දීමට ඇති හැකියාව හඳුනා ගැනීමට අපොහොසත් වන බව ඔහු අවධාරණය කළේය. 377 වගන්තිය පුද්ගලයන්ට ආවේණික ජීව විද්‍යාත්මක නිර්ණායක මත පමණක් නොව, පුද්ගලයාගේ තේරීම් මත පදනම්ව වෙනස් කොට සලකන බව ඔහු හඳුනා ගත්තේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පුද්ගලයෙකුගේ ලිංගික ස්වාධිපත්‍යය සහ පුද්ගලික තේරීම් ආරක්ෂා කරන බව විනිසුරු මිස්රා අවධාරණය කළේය. ඔහු 'ප්‍රකාශිත අත්තනෝමතිකත්වය' (Manifest arbitrariness) සහ 'සාධාරණ වර්ගීකරණ පරීක්ෂණය' (Reasonable classification test) සපුරාලීමට අසමත් වීම යන හේතූන් දෙකම මත 377 වගන්තිය ඉවත් කළේය.

විනිසුරු චන්ද්‍රචූඩ් 377 වගන්තිය "යල් පැන ගිය (anachronistic) යටත් විජිත නීතියක්" ලෙස හැඳින්වූ අතර එය පුරවැසියන් එක් කොටසකට වෙනස් කොට සැලකීමක් සිදු කොට ඇති බව පැවසීය. ලිංගික දිශානතිය සඳහා ඇති අයිතිය පිළිනොගැනීම පුට්ටස්වාමි නඩුව මඟින් පිළිගත් මූලික අයිතිවාසිකමක් වන පෞද්ගලිකත්වය ප්‍රතික්ෂේප කිරීමට හේතු වී ඇති බව ඔහු පැවසීය. සමාජභාවය පිළිබඳව ඔහු සඳහන් කළේ, මිනිසාගේ ලිංගිකත්වය ද්විමය පිරිමි/ගැහැණු ලෙස භාවිතා කරමින් පුද්ගලයන් වර්ගීකරණය කළ නොහැකි බවයි. 377 වගන්තිය නිර්සාපරාධීකරණය කිරීම යනු LGBT ප්‍රජාවගේ ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් සහතික කිරීමේ මාවතේ අවශ්‍යම වන

---

[1] 160 Delhi Law Times 277

[2] Civil Appeal No. 10972 OF 2013

[3] AIR 2018 SC 4321; W. P. (Crl.) No. 76 of 2016; D. No. 14961/2016

[4] Writ Petition (Civil) No 494 of 2012; (2017) 10 SCC 1; AIR 2017 SC 4161

පළමු පියවර පමණක් වන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තවත් බොහෝ දේ අපේක්ෂා කරන බවත් ඔහු සඳහන් කළේය.

සමරිසි භාවය රෝගයක් නොවන බව පිළිගන්නා 2017 මානසික සෞඛ්‍ය ආරක්ෂණ පනත (Mental Healthcare Act) විනිසුරු නාරිමන් විසින් අවධාරණය කරනු ලැබුවේ ය. ඔහු මෙම පනත භාවිතා කරමින් පැවසුවේ, 377 වගන්තියේ ස්වභාවික සහ අස්වාභාවික අතර වෙනස පැහැදිලිවම අත්තනෝමතික වන බවත් එය 14 වැනි ව්‍යවස්ථාව උල්ලංඝණය කරන බවත් ය. තවද, 21 වැනි ව්‍යවස්ථාව යටතේ LGBT පුද්ගලයන්ට ගෞරවාන්විතව ජීවත් වීමට මූලික අයිතිවාසිකමක් ඇති බව විනිසුරු නාරිමන් අවධාරණය කළේය. LGBT ප්‍රජාවට එරෙහිව ඇති සමාජ අපකීර්තිය දුරකරලීම සඳහා අධිකරණයේ තීන්දුව තදින් ම ප්‍රසිද්ධියට පත් කරන මෙන් ඔහු ඉල්ලා සිටියේය. රාජ්‍ය නිලධාරීන් සඳහා, විශේෂයෙන්ම පොලිස් නිලධාරීන් සඳහා සංවේදී පුහුණුවීමක් ලබා දෙන මෙන් ඔහු රජයෙන් ඉල්ලා සිටියේ ය.

21 වැනි ව්‍යවස්ථාවේ ජීවත්වීමේ අයිතිය මඟින් පිළිඹිබු වන සෞඛ්‍යයට ඇති මූලික අයිතිවාසිකම පිළිබඳව විනිසුරු මල්හෝත්‍රා පැහැදිලි කලාය. LGBT වීම සම්බන්ධව ඇති අපකීර්තිය LGBT පුද්ගලයන්ට රහස් ජීවිතයක් ගත කිරීමට බල කරන බව ඇය පෙන්වා දුන්නාය. මෙමඟින් LGBT ප්‍රජාව ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කරයි. ඉන්දියාව පුරා LGBT ප්‍රජාවන් තුළ (HIV/AIDS) සහ අනෙකුත් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග බහුල වීම පිළිබඳව ඇය දැඩි කනස්සල්ල පළ කළාය.

මූලශ්‍රයඃ https://www.scobserver.in/court-case/section-377-case/plain-english-short-summary-of-judgement

**ශ්‍රී ලංකාවේ සමරිසි සහකරුවන් අතර ලිංගික ක්‍රියා නිර්සාපරාධීකරණය කිරීම සඳහා අපට මෙම තර්කයන්ම භාවිතා කළ නොහැක්කේ ඇයි?**

ඉන්දියාවේ විනිසුරුවරුන්ට යම්කිසි නීතියක ව්‍යවස්ථාපිත භාවය තිරණය කළ හැකිය. යම්කිසි නීතියක් ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකමක් උල්ලංඝණය කර ඇති විටක, විනිසුරුවරුන්ට එම නීතිය අවලංගු බවට ප්‍රකාශ කළ හැකිය. මෙය නීති සම්පාදනය පිළිබඳ අධිකරණ සමාලෝචනය ලෙස හඳුන්වනු ලබයි.

නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(3) යන ව්‍යවස්ථාවේ සඳහන් වන ආකාරයට, නීතියක් සම්මත කල පසු එම නීතියේ වලංගුභාවය පිළිබඳව කිසිම අධිකරණයකට ප්‍රශ්න කළ නොහැක. එසේ හෙයින්, නීතියක් සම්මත වූ පසු, මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති අවස්ථාවක වුව ද එහි වලංගුභාවය අධිකරණයට ප්‍රශ්න කල නොහැක. එනම්, ශ්‍රී ලංකාව තුළ, නීති සම්පාදනය පිළිබඳ අධිකරණ සමාලෝචනය කිරීමේ ක්‍රියා පිළිවෙතක් නොමැත. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන ව්‍යවස්ථාවේ සඳහන් වන ආකාරයට, සෑම ලිඛිත සහ ලිඛිත නොවන නීතියක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් සමඟ නොගැලපීමක් ඇති අවස්ථාවක වුවද වලංගු විය යුතු සහ ක්‍රියාත්මක විය යුතුය.
ප්‍රතිඵලයක් ලෙස, සෑම නීතියකම වෙනස්කමක් ම පාර්ලිමේන්තුව මගින් පැමිණිය යුතු වේ.

# සැසිය 07: යෝග්‍යකර්තා මූලධර්ම

*සහභාගීවන්නන් විසින් යුගල වශයෙන් මූලධර්ම කියවා අදාළ අයිතිවාසිකම් සඳහා ඇති අවශ්‍යතාවය සාධාරණීකරණය කරනු ලබයි. ඉන්පසුව slides ආධාරයෙන් දේශනයක් කරනු ලැබේ.*

**කාලය**
පැය 1

**ඉලක්ක කණ්ඩායම**
සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගීවන්නන් 30 කි.

**අරමුණු**
මෙම සැසිය අවසානයේ,

- යෝග්‍යකර්තා මූලධර්ම මඟින් පිළිගත් අයිතිවාසිකම් හඳුනා ගැනීමට,
- ඇතැම් අයිතිවාසිකම් සඳහා අවශ්‍යතාවය දැනගැනීමට

සහභාගීවන්නන්ට හැකි වනු ඇත

**අවශ්‍ය මෙවලම්**
ඇමුණුමේ මුද්‍රණ පිටපත් 30ක්: යෝග්‍යකර්තා මූලධර්ම

**සැකසීම**
Slides

**පියවර:**

- පළමුවන දින සිට යෝග්‍යකර්තා මූලධර්ම පිළිබඳ සාකච්ඡාව සිහිපත් කරන්න.
- සහභාගීවන්නන් අතර යෝග්‍යකර්තා මූලධර්මවල මුද්‍රණ පිටපත් බෙදාහරින්න
- සහභාගිවන්නන්ගෙන් ඔවුන්ගේ දකුණු පස අසුන්ගෙන සිටින පුද්ගලයා සමග යුගල වන ලෙස ඉල්ලා සිටින්න. මූලධර්ම කියවීමට විනාඩි 10 ක් ලබාදෙන්න. ඔවුන් වඩාත්ම උනන්දුවක් දක්වන එක් මූලධර්මයක් සොයා ගෙන ඔවුන් එම අයිතිය වැදගත් යැයි සිතන්නේ මන්දැයි මෙනෙහි කරන්න. මෙම අයිතිය කඩ වුවහොත් කුමක් සිදුවේද?
- විනාඩි 10කට පසු ඔවුන් වඩාත් කුතුහලයට පත් වූ අයිතිවාසිකම් මොනවාදැයි විමසන්න. එම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වැදගත් යැයි ඔවුන් සිතන්නේ මන්දැයි ඔවුන්ගෙන් විමසන්න. මෙම සාකච්ඡාව සඳහා විනාඩි 20 ක් ගන්න. සහභාගීවන්නන්ට ප්‍රශ්න ඇසීමට අවස්ථා ලබා දෙන්න.
- සාකච්ඡාවෙන් පසු slides ආධාරයෙන් දේශනය පවත්වන්න.
- දේශනය සඳහා සටහන් පහත දක්වා ඇත.

**සටහන්**

යෝගකාරතා මූලධර්ම (2006)

2006 දී විධිමත්ව ලේඛනගත අපයෝජන රටාවන්ට ප්‍රතිචාර වශයෙන්, ලිංගික දිශානතිය සහ සමාජභාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිපත්ති මාලාවක් ගෙනහැර දැක්වීමට ජාත්‍යන්තර මානව හිමිකම් විශේෂඥයින් කණ්ඩායමක් ඉන්දුනීසියාවේ යෝග්‍යාකර්තාහිදී රැස්විය. එහි ප්‍රතිඵලය යෝග්‍යකර්තා මූලධර්ම විය: මෙය සියලුම රාජ්‍යයන් අනුකූල විය යුතු ජාත්‍යන්තර නෛතික ප්‍රමිතීන්ට වන බැඳීම තහවුරු කරන මානව හිමිකම් සඳහා වූ විශ්වීය මාර්ගෝපදේශයක් ය. LGBTI ප්‍රජාවන්ට ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් යෙදිය යුතු ආකාරය පිළිබඳ මග පෙන්වීමක් ලෙස ජාතික සහ ජාත්‍යන්තර උසාවිවල යෝග්‍යකර්තා මූලධර්ම යොදාගෙන ඇත.

යෝග්‍යකාර්තා මූලධර්ම මඟින් පුළුල් පරාසයක මානව හිමිකම් ප්‍රමිතීන් සහ ලිංගික දිශානතිය සහ සමාජභාවය පිළිබඳ ගැටළු සඳහා ඒවා යොදාගැනීම පිළිබඳව ආමන්ත්‍රණය කරයි. මේවාට අධිකරණයෙන් පිටත සිදුකරන ඝාතන, ප්‍රචණ්ඩත්වය සහ වධහිංසා පැමිණවීම, යුක්තිය සඳහා ප්‍රවේශය, පෞද්ගලිකත්වය, වෙනස් කොට නොසැලකීම, අදහස් ප්‍රකාශ කිරීමේ සහ රැස්වීමේ නිදහස, රැකියා, සෞඛ්‍ය, අධ්‍යාපනය, ආගමන සහ සරණාගත ගැටළු, මහජන සහභාගීත්වය සහ වෙනත් විවිධ අයිතීන් රාශියක් ඇතුළත් වේ.

මෙම මූලධර්ම මගින් මානව හිමිකම් ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයන්ට ඇති මූලික වගකීම තහවුරු කරයි. සෑම මූලධර්මයකම රාජ්‍යයන් වෙත සවිස්තරාත්මක නිර්දේශයන් ඇතුලත්ව ඇත. කෙසේ වෙතත්, මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට සියලුම ක්‍රියාකාරීන්ට වගකීමක් ඇති බව ද මෙම මූලධර්ම මගින් අවධාරණය කෙරේ. එබැවින්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පද්ධතියට, ජාතික මානව හිමිකම් ආයතනවලට, මාධ්‍යන්ට, රාජ්‍ය නොවන සංවිධානවල සහ අනෙකුත් පාර්ශවයන්ට අතිරේක නිර්දේශයන් (Additional recommendations) ආමන්ත්‍රණය කොට ඇත.

**පූර්විකාව:** පූර්විකාව මගින්, ලිංගික දිශානතිය සහ සමාජභාවය මත පදනම් වූ මානව හිමිකම් කඩකිරීම් පිළිගනී, අදාළ නීතිමය රාමුව ස්ථාපිත කරයි, සහ පාරභාෂිත වචන වල අර්ථ දැක්වීම් සපයයි.

**මානව හිමිකම් භුක්ති විඳීමට ඇති විශ්වීය අයිතිවාසිකම, වෙනස් කොට සැලකීම් නොකිරීම සහ නීතිය ඉදිරියේ පිළිගැනීම:** මූලධර්ම 1 සිට 3 දක්වා මානව හිමිකම්වල විශ්වීයත්වය පිළිබඳ මූලධර්ම සහ වෙනස්කමකින් තොරව සෑම අයෙක්ටම ඒවා අදාළ කර ගැනීම මෙන්ම, සෑම අයෙක්ම නීතිය ඉදිරියේ පිළිගැනීමට ඇති අයිතිය ලබා දෙයි.
උදාහරණය: සමරිසි භාවය සාපරාධී ලෙස සලකන නීති වෙනස් කොට නොසැලකීම පිළිබඳව වන ජාත්‍යන්තර අයිතිය උල්ලංඝණය කරයි (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ තීරණය).

**මානව සහ පුද්ගලික ආරක්ෂාව සඳහා ඇති අයිතිවාසිකම්:** 4 සිට 11 දක්වා වන මූලධර්ම මගින්, ජීවත්වීමට ඇති අයිතිය, ප්‍රචණ්ඩත්වයෙන් හා වධ හිංසාවලින් නිදහස් වීමට ඇති අයිතිය, පෞද්ගලිකත්වය, යුක්තිය වෙත ප්‍රවේශ වීම සහ අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීමෙන් නිදහස් වීමට ඇති අයිතිය යන මූලික අයිතිවාසිකම් ආමන්ත්‍රණය කරයි.
උදාහරණය: මරණීය දණ්ඩනය පැනවීම නොකල යුතු බව එක්සත් ජාතීන්ගේ යෝජනා අවධාරණය කර තිබියදීත්, කැමැත්ත මත පවතින සමරිසි වැඩිහිටි පුද්ගලයින් අතර ලිංගික ක්‍රියාකාරකම් සඳහා මරණ දඬුවම දිගටම ක්‍රියාත්මක වේ.

**ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම්:** 12 සිට 18 දක්වා වන මූලධර්ම මගින් රැකියා, නවාතැන්, අධ්‍යාපනය සහ සෞඛ්‍ය ඇතුළු ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී වෙනස් කොට නොසැලකීමේ වැදගත්කම ඉස්මතු කරයි.
උදාහරණ: සමරිසි කාන්තාවන් සහ සංක්‍රාන්තික සමාජභාවීය කාන්තාවන් වෙනස් කොට සැලකීම, නිවාස නොමැතිකම සහ ප්‍රචණ්ඩත්වයේ වැඩි අවදානමක් ඇත (ප්‍රමාණවත් නිවාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුගේ වාර්තාව).

**ප්‍රකාශනයට, මතයට සහ සමාගමට ඇති අයිතිවාසිකම්:** 19 සිට 21 දක්වා වූ මූලධර්ම මගින් මහජන රැස්වීම්වලට සහ උත්සවවලට සාමකාමීව සහභාගී වීමේ අයිතිය ඇතුළුව, ලිංගික දිශානතිය, සමාජභාවය මත පදනම්ව රාජ්‍ය මැදිහත්වීමකින් තොරව තමාගේ අනන්‍යතාව සහ තම ලිංගිකත්වය ප්‍රකාශ කිරීමට ඇති නිදහසේ වැදගත්කම අවධාරණය කරයි.
උදාහරණය: ලිංගික දිශානතිය සහ සමාජභාවය පදනම් කරගෙන සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ සාමකාමී රැස්වීමක් බලධාරීන් විසින් තහනම් කරන ලද අතර, "අපි පොන්නයෝ අල්ලා ගමු" (Let's get the fags) සහ " හිට්ලර් යුදෙව්වන්ට කරපු දේ අපි ඔබලාට කරන්නෙමු" (We'll do to you what Hitler did with Jews) වැනි සටන් පාඨ කියමින් පොලිසිය සහ අන්තවාදී ජාතිවාදීන් කැගැසීමින් සහභාගීවන්නන්ට හිරිහැර හා බිය ගැන්වීම්වලට ලක් කරන ලදී. (ජාතිවාදයේ සමකාලීන ආකාර, වාර්ගික වෙනස්කම් කිරීම්, අතිජී භීතිකාව (xenophobia) සහ ඒ හා සම්බන්ධ නුරුස්සන බව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුගේ වාර්තාව)

**චලනය වීමේ නිදහස සහ සරණාගතභාවය:** 22 සහ 23 මූලධර්ම මගින් ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව හිංසා පීඩා වලින් සරණාගතභාවය ලබා ගැනීමට පුද්ගලයින්ට ඇති අයිතිවාසිකම් ඉස්මතු කරයි.
උදාහරණය: ලිංගික දිශානතිය මත පදනම් වූ පීඩා පිළිබඳ මනා පදනමක් සහිත බියක් ඇති පුද්ගලයින්ට සරණාගත ආරක්ෂාව ලබා දිය යුතුය. (එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වන මහ කොමසාරිස්ගේ මාර්ගෝපදේශ)

**සංස්කෘතික සහ පවුල් ජීවිතයට සහභාගී වීමේ අයිතිවාසිකම්:** 24 සිට 26 දක්වා වන මූලධර්ම ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව වෙනස් කොට සැලකීමකින් තොරව පවුල් ජීවිතය, පොදු කටයුතු සහ ඔවුන්ගේ ප්‍රජාවේ සංස්කෘතික ජීවිතයට සහභාගී වීමේ අයිතිවාසිකම් ආමන්ත්‍රණය කරයි.
උදාහරණය: විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැනි හවුල්කාර ප්‍රතිලාභ ලබා දීමේදී සමරිසි සබඳතා වෙනස්කොට නොසැලකීමට රාජ්‍යයන්ට බැඳීමක් ඇත. වැටුප් (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ තීරණය)

**මානව හිමිකම් ආරක්ෂකයන්ගේ අයිතිවාසිකම්:** 27 වන මූලධර්මය ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව වෙනස් කොට සැලකීමකින් තොරව මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ඇති අයිතිය සහ මෙම ප්‍රදේශවල සේවය කරන මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ආරක්ෂාව සහතික කිරීමට රාජ්‍යයන්ගේ බැඳීම පිළිගනී.
උදාහරණය: ලොව පුරා ලිංගික දිශානතිය සහ අනන්‍යතාවය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන මානව හිමිකම් ආරක්ෂකයින් "තර්ජනයට ලක්ව ඇත; ඔවුන්ගේ නිවාස සහ කාර්යාල වටලා, ඔවුන්ට පහරදීම්, වධහිංසා පැමිණවීම්, ලිංගික අපයෝජනයන්, නිරන්තර මරණ තර්ජනවලින් වද හිංසාවලට ලක්වීම සහ මරා දැමීම පවා සිදු

කර ඇත.. එවැනි සිද්ධීන් පිළිබඳව අදාළ බලධාරීන් විසින් බරපතල ලෙස සැලකීමක් නොකරයි." (මානව හිමිකම් ආරක්ෂකයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ විශේෂ නියෝජිතයාගේ වාර්තාව).

**වන්දි ගෙවීමේ අයිතිවාසිකම් සහ වගවීම:** 28 සහ 29 යන මූලධර්ම මගින් අයිතිවාසිකම් කඩකරන්නන් වගවීමේ වැදගත්කම සහ අයිතිවාසිකම් කඩවීම්වලට මුහුණ දෙන අයට සුදුසු සහන ලබාදීමේ වැදගත්කම තහවුරු කරයි.
උදාහරණය: එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයා "LGBT පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ අපරාධ සඳහා දණ්ඩමුක්තිය" සහ "ඵලදායි ආරක්ෂාව ලබාදීමට රාජ්‍යයට ඇති වගකීම" ගැන කනස්සල්ල පළ කර ඇත. මහ කොමසාරිස්වරයා සඳහන් කරන්නේ, "LGBT පුද්ගලයන් මෙම ආරක්‍ෂාවන් ගෙන් බැහැර කිරීම යනු පැහැදිලිවම ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය මෙන්ම අප සියල්ලන් නිර්වචනය කරන මනුෂ්‍යත්වයේ පොදු ප්‍රමිතීන් උල්ලංඝණය කිරීමක්" බවයි.

**අතිරේක නිර්දේශයන්:** මෙම මූලධර්ම මගින් ජාතික මානව හිමිකම් ආයතන, වෘත්තීය ආයතන, අරමුදල් සපයන්නන්, රාජ්‍ය නොවන සංවිධාන, මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ගිවිසුම් ආයතන, විශේෂ ක්‍රියා පටිපාටි සහ වෙනත් අය සඳහා අතිරේක නිර්දේශයන් 16ක් දක්වා ඇත.
උදාහරණ: මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සහ මෙම ප්‍රමිතීන් ඔවුන්ගේ කාර්යයට ඒකාබද්ධ කිරීම සඳහා ක්‍රියාකාරීන් පරාසයක වගකීම හඳුනා ගැනීමෙන් මෙම මූලධර්මයන් අවසන් වේ. 2006 දෙසැම්බර් 1 වැනි දින එක්සත් ජාතීන්ගේ කලාප පහෙන් හතරකින්, රාජ්‍යයන් 54ක් විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශයක් වන, "ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය මත පදනම් වූ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳව නිසි අවධානය යොමු කරන ලෙස" මානව හිමිකම් කවුන්සිලයෙන් ඉල්ලා සිටියි.
එසේම මෙම ප්‍රදේශයේ සිවිල් සමාජයේ ක්‍රියාකාරිත්වය පවරමින් "සියලු විශේෂ ක්‍රියාපටිපාටි සහ ගිවිසුම් ආයතනවලට ඔවුන්ගේ අදාළ විධානයන් තුළ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය මත පදනම් වූ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ සලකා බැලීම අඛණ්ඩව ඒකාබද්ධ කරන ලෙස" ඉල්ලා සිටී. මෙම ප්‍රකාශය පිළිගන්නා පරිදි, යෝග්‍යකර්තා මූලධර්ම මගින් තහවුරු කර ඇති පරිදි, ඵලදායී මානව හිමිකම් ආරක්ෂා කිරීම සැබවින්ම සැමගේ වගකීමකි.

**යෝග්කාරතා +10 (2017)**
2017 නොවැම්බර් 10 වැනි දින, විශේෂඥ මණ්ඩලයක් විසින් යෝග්‍යකර්තා මූලධර්ම ප්ලස් 10 ප්‍රකාශයට පත් කරන ලදී. එය මුල් යෝග්‍යකර්තා මූලධර්ම 29ට අතිරේක වන අතර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන්, දරිද්‍රතාවය සහ සංස්කෘතික විවිධත්වය සමඟ කටයුතු කරන අයිතිවාසිකම් පරාසයක් ආවරණය වන පරිදි අතිරේක මූලධර්ම නවයක් ඉදිරිපත් කරයි. . අතිරේක රාජ්‍ය වගකීම් 111ක් ද ඇත, ඒවායින් ගණනාවක්, වධහිංසා පැමිණවීම, සරණාගතභාවය, පෞද්ගලිකත්වය සහ සෞඛ්‍යය සහ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ආරක්ෂාව වැනි ක්ෂේත්‍ර ඇතුළුව මුල් මූලධර්ම 29 සම්බන්ධයෙන් පැන නැඟී ඇත.

**අතිරේක මූලධර්ම නවය:**
30 වන මූලධර්මය - රාජ්‍ය ආරක්ෂාව සඳහා ඇති අයිතිය
31 වන මූලධර්මය - නීතිමය පිළිගැනීමට ඇති අයිතිය
32 වන මූලධර්මය - කායික හා මානසික ඒකාග්‍රතාවයට ඇති අයිතිය
33 වන මූලධර්මය - SOGIESC මත පදනම් වූ අපරාධකරණයෙන් සහ දණ්ඩනයෙන් නිදහස් වීමේ අයිතිය
34 වන මූලධර්මය - දරිද්‍රතාවයෙන් ආරක්ෂා වීමට ඇති අයිතිය
35 වන මූලධර්මය - සනීපාරක්ෂාව සඳහා ඇති අයිතිය
36 වන මූලධර්මය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධයෙන් මානව හිමිකම් භුක්ති විඳීමේ අයිතිය
37 වන මූලධර්මය - සත්‍යයට දැනගැනීමට ඇති අයිතිය
38 වන මූලධර්මය - සංස්කෘතික විවිධත්වය පුහුණු වීමට, ආරක්ෂා කිරීමට, ආරක්ෂා කිරීමට සහ ලබා ගැනීමට ඇති අයිතිය

**මූලාශ්‍රය:**
https://www.amnestyusa.org/pdfs/YogyakartaPrinciples.pdf?_sm_au_=iVV5402rZ6PZQ066

**ඇමුණුම:**

| | |
|---|---|
| PRINCIPLE 1 | The Right to the Universal Enjoyment of Human Rights |
| PRINCIPLE 2 | The Rights to Equality and Non-Discrimination |
| PRINCIPLE 3 | The Right to Recognition before the Law |
| PRINCIPLE 4 | The Right to Life |
| PRINCIPLE 5 | The Right to Security of the Person |
| PRINCIPLE 6 | The Right to Privacy |
| PRINCIPLE 7 | The Right to Freedom from Arbitrary Deprivation of Liberty |
| PRINCIPLE 8 | The Right to a Fair Trial |
| PRINCIPLE 9 | The Right to Treatment with Humanity while in Detention |
| PRINCIPLE 10 | The Right to Freedom from Torture and Cruel, Inhuman or Degrading Treatment or Punishment |
| PRINCIPLE 11 | The Right to Protection from all Forms of Exploitation, Sale and Trafficking of Human Beings |
| PRINCIPLE 12 | The Right to Work |
| PRINCIPLE 13 | The Right to Social Security and to Other Social Protection Measures |
| PRINCIPLE 14 | The Right to an Adequate Standard of Living |
| PRINCIPLE 15 | The Right to Adequate Housing |
| PRINCIPLE 16 | The Right to Education |
| PRINCIPLE 17 | The Right to the Highest Attainable Standard of Health |
| PRINCIPLE 18 | Protection from Medical Abuses |
| PRINCIPLE 19 | The Right to Freedom of Opinion and Expression |
| PRINCIPLE 20 | The Right to Freedom of Peaceful Assembly and Association |
| PRINCIPLE 21 | The Right to Freedom of Thought, Conscience and Religion |
| PRINCIPLE 22 | The Right to Freedom of Movement |
| PRINCIPLE 23 | The Right to Seek Asylum |
| PRINCIPLE 24 | The Right to Found a Family |
| PRINCIPLE 25 | The Right to Participate in Public Life |
| PRINCIPLE 26 | The Right to Participate in Cultural Life |
| PRINCIPLE 27 | The Right to Promote Human Rights |
| PRINCIPLE 28 | The Right to Effective Remedies and Redress |
| PRINCIPLE 29 | Accountability |
| PRINCIPLE 30 | The Right to State Protection |
| PRINCIPLE 31 | The Right to Legal Recognition |
| PRINCIPLE 32 | The Right to Bodily and Mental Integrity |
| PRINCIPLE 33 | The Right to Freedom from Criminalisation and Sanction on the Basis of Sexual Orientation, Gender Identity, Gender Expression or Sex Characteristics |
| PRINCIPLE 34 | The Right to Protection from Poverty |
| PRINCIPLE 35 | The Right to Sanitation |
| PRINCIPLE 36 | The Right to the Enjoyment of Human Rights in Relation to Information and Communication Technologies |
| PRINCIPLE 37 | The Right to Truth |
| PRINCIPLE 38 | The Right to Practise, Protect, Preserve and Revive Cultural Diversity |

BRIDGE to EQUALITY
සමානාත්මතාවය සොයා...
சமத்துவத்தை தேடுதல்...

BRIDGE to Equality යනු ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන්ගේ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ජාත්‍යන්තර මානව හිමිකම් සහ නීති පිලිබඳව විනිසුරුවරුන්, නීතීඥයින් සහ අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම, ශ්‍රී ලංකාවේ වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම, මානව හිමිකම් කඩ වූ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් හට යුක්තිය ලබා ගැනීමට ඔවුනට අවශ්‍ය සහය ලබාදීමද අරමුණු කරගනී.

BRIDGE to Equality ව්‍යාපෘතිය 2021 වසරේ සිට DAST, National Transgender Network සහ Young Out Here ආයතන විසින් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.


facebook.com/BridgetoEquality
instagram.com/bridgetoequality2021
twitter.com/B2ECampaign
bridgetoequalitycampaign@protonmail.com